## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 100

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුව

**(සිව්වැනි සභාවාරය)**

**ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන**
**පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ**
වාර්තාව

**කාරක සභාවේ සභාපති**

**ගරු ජනාධිපති නීතිඥ, ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා**

**විසින් ඉදිරිපත් කරන ලදී.**

මුද්‍රණය කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියම කළේ 2023 ජූලි මස 21 වන දින

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 100

# පටුන


පිටු අංක

**01 වැනි පරිච්ඡේදය**

- යොමු කිරීමේ අනුදේශ 1
- කාරක සභාවේ සාමාජිකයන් නම් කිරීම 2

**02 වැනි පරිච්ඡේදය - ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය** 3

**03 වැනි පරිච්ඡේදය - උසස් අධ්‍යාපනය** 11

**04 වැනි පරිච්ඡේදය - කාරක සභාවේ නිර්දේශ** 33

- මුල් ළමාවිය, ළදරු පාසල් අධ්‍යාපනය 33
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය 34
- උසස් අධ්‍යාපනය 36
  - I. රාජ්‍ය විශ්ව විද්‍යාල 38
  - II. රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල/ ආයතන 39
  - III. වෘත්තීය අධ්‍යාපන විශ්ව විද්‍යාල/ ආයතන 40
  - IV. තත්ත්ව සහතිකය 41


## වගු ලැයිස්තුව


වගු අංක 1: විවිධ ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල 18

වගු අංක 2: රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනය සඳහා සිසුන් බඳවා ගැනීම 20

වගු අංක 3: විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ඉදිරිපත් කරන ලද පාසල් සහ උසස් අධ්‍යාපනය ආශ්‍රිත සංඛ්‍යා දත්ත 21

වගු අංක 4: 2021 වසරේ රජයේ විශ්ව විද්‍යාල වලට විෂයයන් අනුව ඇතුළත් වීම. 23

වගු අංක 5: උපාධිධාරී සේවා නියුක්තිය ආශ්‍රිත සංඛ්‍යා දත්ත 23

වගු අංක 6: විවිධ උපාධි පාඨමාලාවන්හි උපාධි අපේක්ෂකයෙකු සඳහා වසරකට ඇස්තමේන්තුගත පිරිවැය 24

වගු අංක 7: මෑත වසරවල අධ්‍යාපනය සඳහා වෙන් කිරීම දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස 25

වගු අංක 8: අධ්‍යයන පුරප්පාඩු සංඛ්‍යාව (ස්ථිර සේවක) 28


## රූපසටහන් ලැයිස්තුව


රූපය 1:ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අසමමිතික ස්වභාවය 17


## ප්‍රස්ථාර ලැයිස්තුව


ප්‍රස්තාරය 1: රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීමේ ප්‍රවණතා 20

ප්‍රස්තාරය 2: විවිධ උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයෙකු සඳහා වසරකට ඇස්තමේන්තුගත පිරිවැය 24

ප්‍රස්තාරය 3: අධ්‍යයන පුරප්පාඩු වල ප්‍රවණතා (ස්ථිර සේවක) 29

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 100

# වාර්තාව

පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා විසින් 2022 දෙසැම්බර් මස 13 වැනි දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ කාරක සභාවක් පත් කරනු පිණිස වූ පහත සඳහන් යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

## 01 වැනි පරිච්ඡේදය

## යොමු කිරීමේ අනුදේශ

1. *ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාව:*

*අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඉහළින් සමත් සිසුන් විශාල පිරිසකට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වන හෙයින්ද;*

*උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කළ යුතුව ඇති හෙයින්ද;*

*ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.*

*2. (අ) එහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතුය; සහ*

*(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව එම කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් (11) දෙනකුගෙන් සමන්විත විය යුතුය;*

*3. එම කාරක සභාවට*

*(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;*

*(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමටද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට*

*ඕනෑම තැනැත්තකුට නියම කිරීමටද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව ලබා ගැනීමටද;*

*(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමටද; සහ*

*(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණද රැස්වීම් පවත්වාගෙන යාමටද,*
*බලය තිබිය යුතුය.*

*4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස දෙකක (02) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන කාලපරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුට ඉදිරිපත් කළ යුතුය.*

## කාරක සභාවේ සාමාජිකයින් නම් කිරීම

**1.1** පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද යෝජනාව ප්‍රකාරව, ගරු කථානායකතුමා මෙම කාරක සභාව සඳහා ජනාධිපති නීතිඥ ගරු ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නම් කළ අතර, එම නාමයෝජනා 2023 ජනවාරි 20 වැනි දින පාර්ලිමේන්තුවේදී නිවේදනය කරන ලදී.

ගරු ජනාධිපති නීතිඥ, ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා (කාරක සභාවේ සභාපති)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු (වෛද්‍ය) සීතා අරඹේපොළ මහත්මිය
ගරු අ. අරවින්ද් කුමාර් මහතා (2023.05.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි)
ගරු ආචාර්ය සුරේන් රාඝවන් මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු තිස්ස අත්තනායක මහතා (2023.04.19 දින දක්වා)
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය (2023.05.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි)
ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා (2023.05.09 දින දක්වා)
ගරු මහාචාර්ය චරිත හේරත් මහතා
ගරු ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය

**1.2** ගරු ආචාර්ය සුරේන් රාඝවන් මහතා පළමු දින රැස්වීමට සහභාගි වූ අතර කාරක සභාවෙන් තමන් ඉල්ලා අස්වන බව දන්වන ලදී.

**1.3** කාරක සභාව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් වෙතින් තොරතුරු ලබා ගනිමින් සිටින අතරතුර, විෂයය පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කාරක සභාවට ලබා දෙන ලද මාස 2ක කාලය ප්‍රමාණවත් නොවන්නේය යන්න කාරක සභාවේ අදහස විය. ඒ අනුව කාරක සභාවේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුව 2023 ජූලි 21 දක්වා කාරක සභාවේ කාලය දීර්ඝ කරන ලදී.

**1.4** කාරක සභාව ඉදිරියට පැමිණ සිය නියෝජනයන් ඉදිරිපත් කළ ආයතන හා පුද්ගලයන් ලැයිස්තුව X-1 ලෙස සලකුණු කර මෙම වාර්තාවට අමුණා ඇත.

## 2 වැනි පරිච්ඡේදය

## ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය

**2.1** කාරක සභාවට ලබා දුන් කාර්ය පැවරුම වූයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉඩප්‍රස්ථා පුළුල් කිරීම සඳහා නිර්දේශ කිරීමයි. ඉහත කාර්යය සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා ශක්‍ය හා තිරසාර නිර්දේශයන් ඉදිරිපත් කිරීමට නම් පවත්නා නීති රාමුව හා පද්ධතිය තුළ භාවිත කෙරෙන පිළිවෙත් පරිපූර්ණ හා විස්තරාත්මක ලෙස විමර්ශනය කිරීම අනිවාර්ය වේ.

**2.2** උසස් අධ්‍යාපනයේ පදනම ලෙස සේවය සලසන ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය තුළ ප්‍රමාණාත්මකතාව හා ගුණාත්මකතාව සහ අනුගමනය කෙරෙන ප්‍රමිතීන් මත උසස් අධ්‍යාපනය ගොඩනැගෙන බැවින් උසස් අධ්‍යාපන විෂයය පිළිබඳව හුදෙකලාව සැලකීම මගින් අපට අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට පිටුවහලක් නොවනු ඇත.

**2.3** ඒ අනුව, උසස් අධ්‍යාපනය තුළ කරනු ලැබිය යුතු අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමට පෙර, සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳව හඳුනා ගැනීම, එහි අඩුපාඩුකම්, හිදැස් හා වැරදියට මෙහෙයවන ලද ක්ෂේත්‍ර පිළිබඳව හඳුනා ගැනීම වැදගත්ය.

**2.4** ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍යයට පැහැදිලි හා නිශ්චිත ප්‍රතිපත්තියක් නොමැති බව පෙනී යයි. 1945 වර්ෂයේදී එවකට අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මහතා විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වාදෙන ලද අතර, එයට කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණ හේතුවෙන් හා කලින් කලට පත්වූ රජයන් විසින් අනුගමනය කරන ලද පිළිවෙත් ඇතුළු නොයෙක් මැදිහත්වීම් හේතුවෙන් විකෘති වී තිබේ.

**2.5** ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මහතා පොකුරු පාසල් ක්‍රමය ඇති කළ අතර එහිදි පාසල් කීපයක් (3—6 දක්වා සංඛ්‍යාවක්) පෝෂක ප්‍රාථමික පාසල් ලෙසද, කේන්ද්‍රික පාසලක් (මධ්‍ය මහා විද්‍යාලය) ද්විතියික පාසල ලෙසද ක්‍රියාත්මක විය.

**2.6** රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් 1946 වර්ෂයේ "සැමට නිදහස් අධ්‍යාපනය" හඳුන්වා දීම මඟින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තිය 1960 වර්ෂයේ ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද ආනුෂංගික නීති මගින් ශක්තිමත් කරන ලද අතර ප්‍රධාන වශයෙන් පල්ලි විසින් පවත්වා ගෙන යනු ලැබූ පෞද්ගලික පාසල්, රජයේ අධීක්ෂණය හා පාලනය යටතට ගෙන එන ලදී.

**2.7** 1977 වර්ෂයේ ආර්ථිකය නිදහස් කිරීමත් සමගම අංශ තුනෙහිම, එනම් ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අංශයන්හි පෞද්ගලික අධ්‍යාපනය සඳහා දොරටු විවර වූයේ ප්‍රතිපත්ති පාදක ක්‍රමවේදයකට නොව, ඒ ඒ අවස්ථාවට අනුව යොදා ගත් ක්‍රමවේද අනුවය.

**2.8** එහි ප්‍රතිඵලයක් ලෙස, අධ්‍යාපනයද ව්‍යවසායකත්වයේ අංශයක් බවට පත්වෙමින් සහ කැපී පෙනෙන ලෙස වඩාත් ඉහළ ලාභ ඉපයීම කෙරෙහි ඉහළම ප්‍රමුඛත්වය දෙමින් පුළුල් විය.

**2.9** එහෙත් ප්‍රාථමික, ද්විතියික හා තෘතියික හෝ උසස් අධ්‍යාපනය වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තියකට අනුගත වීමට, අධ්‍යාපනය සම්බන්ධයෙන් නිසි නියාමන ක්‍රමයක් සහතික කිරීමට හෝ අධ්‍යාපනය තුළ ගුණාත්මකතාව හා ප්‍රමිති පවත්වා ගෙන යාමට—රජය අපොහොසත්ව ඇති බව නිරීක්ෂණය කෙරේ.

**2.10** මෙම තත්ත්වය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමත් සමගම සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ තිබූ පාසල්, ජාතික පාසල් හා පළාත් පාසල් ලෙස වර්ගීකරණය කිරීමෙන් තවත් අයහපත් තත්ත්වයට පත්ව ඇත.

**2.11** අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයන ලද සංඛ්‍යා දත්තවලින් පෙනී යන පරිදි ජාතික පාසල් හා පළාත් පාසල් ලෙස, පාසල් වර්ගීකරණය කිරීම තුළ විෂමතාවක් ඇති වී තිබේ. එම සංඛ්‍යා දත්තවලට අනුව, ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු පාසල් සංඛ්‍යාව සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 14% ක් ( පාසල් 1439 ක්) වන අතර 51 සිට 100 දක්වා ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින පාසල් සංඛ්‍යාව සමස්ත පාසල් සංඛ්‍යාවෙන් 15% ක් (පාසල් 1523 ක්) වේ. මෙම වෙනස විවිධ ප්‍රදේශයන්හි තිබෙන පහසුකම්, සම්පත් මත ඇති වෙනස්කම් හේතුවෙන් වන අතර සෑම තැනම නොතිබිය හැක.

**2.12** මෙම විෂමතාව හේතුවෙන්, ජාතික හෝ ජනප්‍රිය පාසල්වලට සිය දරුවන් ඇතුළු කිරීම සුරක්ෂිත කර ගැනීම සඳහා වූ තරඟයකට අවතීර්ණ වීමට සිදුවන අතර, බොහෝ විට ඒ සඳහා ව්‍යාජ ලියැවිලි සැකසීමට, අල්ලස් දීමට පවා දෙමව්පියන් පෙළඹෙන අතර,

අවසානයේදී තමා අපේක්ෂා කළ ප්‍රතිඵලය අත්කර ගැනීමට නොහැකි වූ විට ඉච්ඡා භංගත්වයට පත්වේ. මෙම තත්ත්වය රට පුරාම, බෙහෙවින්ම නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි, නොයෙක් ආර්ථික, සාමාජීය හා සෞඛ්‍ය ගැටළුවලට මඟ පාදා ඇත.

**2.13** එමෙන්ම ජනවර්ගය, භාෂාව හා ආගම මත පදනම්ව ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා පාසල් විවෘත කිරීමේ හා නම් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය, සමාජය තුළ ජනවාර්ගික, භාෂාමය හා ආගමික අසමඟියට දායක වී ඇති බව, එසේත් නැති නම් යටත් පිරිසෙයින් ජාතික සමඟියට බාධකයක්ව පවතින බව සඳහන් කිරීම වැදගත් වේ.

**2.14** ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය තුළ මුල් බැස ගෙන ඇති එක් විනාශකාරී සංස්කෘතියක් වන්නේ ප්‍රධාන වශයෙන් සරු ව්‍යාපාරයක් ලෙස වර්ධනය වෙමින් ඇති පෞද්ගලික උපකාරක පංති පැවැත්වීමයි. බොහෝ පාසල්වල සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගවලට සූදානම් වන සිසුන්ට ඉගැන්වීමට සිටින සුදුසුකම් ලත් හා පුහුණු ගුරුවරුන්ට එම විභාගවලට මාස 6–10 ක් තිබියදී සිය කාලය කා දමමින් පංතිවලට වී අකර්මණ්‍යව සිටීමට සිදු වේ. මෙය සිදු වන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සන්සන්දනාත්මක ලෙස ඉහළ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වන තරඟය තුළ වර්ධනය වන මානසික පීඩනය හේතුවෙන් පාසලට පැමිණීම වෙනුවට පෞද්ගලික උපකාරක පංතිවලට සහභාගී වීමට වැඩි වැඩියෙන් පෙළඹීම නිසාය.

**2.15** දෙමව්පියන්ද සිය දරුවන්ට විශිෂ්ටතම අධ්‍යාපනය ලබා දීමේ බලාපොරොත්තුවෙන් පෞද්ගලික උපකාරක පංති සඳහා සහභාගී වීමට සිය දරුවන් දිරිගැන්වීමට නැඹුරු වී ඇත. කෙසේ වුවද, මෙම පංතිවලින් බොහොමයක අය කරන ගාස්තු දෙමව්පියන්ට දැරිය නොහැකි මට්ටමේ පැවතියද, ඒවායේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මූලික පහසුකම් පවා ලබා නොදීම ඛේද ජනකය. යටත් පිරිසෙයින් පෞද්ගලික උපකාරක පංතිවල අධ්‍යාපනයේ ගුණාත්මකතාව තහවුරු කරනු පිණිස නියාමන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට රජය අපොහොසත් වී තිබේ.

**2.16**5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ අරමුණ ජාතික හෝ ජනප්‍රිය පාසල්වලට දරුවන් ඇතුළු කරවීම වන බැවින් එම විභාගය මෙම අධ්‍යාපන තරඟයේ ආරම්භය සනිටුහන් කරන බව සඳහන් කළ යුතුය. අවාසනාවට, අධ්‍යාපන බලධාරීන් සහ දෙමව්පියන් යන දෙපිරිසම එබඳු මොළකැටි වියේ සිටින දරුවන් මත අනිසි පීඩනයක් යෙදීමෙහි ඇති බරපතලකම වටහා ගැනීමට අසමත්ව ඇත. මෙම පීඩනය ඔවුන්ගේ ජීවිතයේ පසු කාලයක අනපේක්ෂිත විවිධ මානසික තත්ත්වයන් ඇති කිරීමට ඉඩ තිබෙන අතර එබඳු වෙහෙසකර නිරතවීම්වල ප්‍රතිවිපාක සොයා ගනු පිණිස සමීක්ෂණයක් පැවැත්වීම කාලීන අවශ්‍යතාවකි.

**2.17** ළමුන්ගේ වයස සහ බුද්ධි මට්ටම සලකා බැලීමේදී එවැනි අනවශ්‍ය සහ වෙහෙසකර තරඟකාරිත්වය දරාගත නොහැකි යැයි සලකනු ලබන බැවින්, අධ්‍යාපනයේ විශිෂ්ට මට්ටමකට ළඟා වී ඇති රටවල් ළමුන් මත එවැනි අනවශ්‍ය සහ වෙහෙසකර තරඟකාරිත්වයක් පැටවීම අහෝසි කර ඇත.

**2.18** කිසිදු රාජ්‍ය ආයතනයක් විසින් නියාමනය නොකරන ජාත්‍යන්තර පාසල් රාශියක් ඇති බව ද නිරීක්ෂණය වේ. මෙම පාසල් ස්ථාපිත කර ඇත්තේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් ලෙස ලියාපදිංචි වීමෙනි. "ජාත්‍යන්තර පාසල්" යන ලේබලය යටතේ පුද්ගලික ආයතන ලෙස ක්‍රියාත්මක වුවද, ඒවායේ ප්‍රමිතීන් ජාත්‍යන්තර තත්වයෙන් යුතු බව තහවුරු කිරීමට සහ ඒවා රජය විසින් සම්මත කොට ඇති මූලික ප්‍රතිපත්ති වලට අනුකූල වන ලෙස නියාමනය කිරීමට යාන්ත්‍රණයක් හෝ අධිකාරියක් නොමැත.

**2.19** පුළුල්ව පැතිරී ඇති මාධ්‍ය සංස්කෘතිය, ප්‍රධාන ධාරාව මෙන්ම සමාජ මාධ්‍ය සිසුන්ට කියවීමේ පුරුද්දෙන් ඈත් වීමට බෙහෙවින් බලපා ඇති අතර සිසුන් අධ්‍යාපනයට සම්බන්ධ වීමට දිරිගැන්වීමට මාධ්‍යය විසින් දක්වන්නේ ඉතා සුළු දායකත්වයකි. ඒ වෙනුවට ඔවුන් විසින් ඕපාදූප බැලීමේ හා කියවීමේ සංස්කෘතියක් ඇති කර ඇති අතර සමහර දෙමාපියන් හට එවැනි පැති පිළිබඳව දැනුවත් භාවයක් නොමැත. නොමඟ යවන සුළු මාධ්‍ය සංස්කෘතිය නිසා දරුවන්ගේ මුළු ජීවිතයම අහිමි වන හෝ අනාගතය කඩාකප්පල් වන අවස්ථා තිබේ.

**2.20** ළදරු පාසල් සහ මුල් ළමාවිය අධ්‍යාපනය යනු බලධාරීන් විසින් නොසලකා හරින ලද සහ අත්හැර දමන ලද තවත් අංශයක් බවද කමිටුව නිරීක්ෂණය කළේය. වැරදි සහ අයෝග්‍ය ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමෙන් දරුවන් අධ්‍යාපනයෙන් අධෛර්යමත් නොකිරීමට වගබලා ගනිමින් මේ සම්බන්ධයෙන් නිසි හා ඵලදායී ප්‍රතිපත්තියක් සැකසීමට රජය බැඳී සිටී.

**2.21** ද්විතීයික අධ්‍යාපන ධාරාව තුල වෘත්තීය අධ්‍යාපනය සඳහා සිසුන් දිරිමත් කිරීමට ප්‍රමාණවත් ආකර්ෂණයක් නොමැති බව ද අවධාරණය කෙරිණි.

**2.22** අප රටේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ පවතින සමස්ත රාමුව සලකා බැලීමේදී, පසුගිය දශක හතරේ සිට පහ දක්වා කාලය තුළ, පහත දක්වා ඇති විවිධ හේතූන් මත එය නැවත වැඩවසම් යුගයට හැරී ඇත;

(i) කලින් කලට නොයෙකුත් සමාජ වෙනස්කම් හා නොසන්සුන්තා ඇති කරමින් සමාජීය බෙදීම් ඇති කරන්නාවූ ජාතික පාසල්, පළාත් පාසල්, ජනප්‍රිය පාසල් සහ ඊට අමතරව සිංහල පාසල්, බෞද්ධ පාසල්, දෙමළ පාසල්, හින්දු පාසල්, මුස්ලිම් පාසල්, කතෝලික පාසල් ලෙස පාසල් වර්ගීකරණය කිරීමට රජය යොමු වී ඇත.

(ii) ජාතික හා ජනප්‍රිය පාසල්, ආදි ශිෂ්‍ය සංගම්වල ග්‍රහණයට ලක්ව ඇති අතර නව වැඩවසම්වාදය පිළිබිඹු කරමින් එම පාසල්වල තම දරුවන්ට පමණක් අධ්‍යාපනය ලබා දිය යුතු බව සහතික කිරීම සඳහා ඔවුන් ඒවා තම පාලනය යටතේ තබා ගැනීමට හැකි සෑම ආකාරයකින්ම යොමු වී සිටී.

(iii) ජාතික හා ජනප්‍රිය පාසල්වලට විශාල වාසියක් ලබා දෙමින් රජය විසින් අසමානුපාතික ලෙස අරමුදල් වෙන් කිරීම හේතුවෙන් ඒවා සහ අනෙකුත් පාසල් අතර විශාල පරතරයක් නිර්මාණය වී ඇත.

(iv) මානව සම්පත් ඇතුළුව සම්පත් අසමාන ලෙස බෙදීයාම හේතුවෙන් බොහෝ පාසල් වල ගුරු අතිරික්තයක් පවතිද්දී ඇතැම් පාසල් වල බරපතල ගුරු හිඟයක් පවතී. එබැවින් අවශ්‍ය අවම සංඛ්‍යා පවත්වා ගෙන යාම අවශ්‍යය.

(v) පාසල් අධ්‍යාපනයේ සම මට්ටමක් ස්ථාපිත කිරීමේ ඉදිරි ගමනට බාධා කිරීමට පාසල් පිළිබඳ සමාජ ආකල්ප ද විශාල වශයෙන් දායක වී ඇත.

(vi) පෞද්ගලික පාසල් පද්ධතිය සහ පෞද්ගලික උපකාරක පන්ති ක්‍රමය ඔවුන්ටම ආවේණික වූ ආකෘති සමඟින් ඉදිරියට ගමන් කරන අතර ඒවායින් බොහොමයක් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමට දායක නොවේ.

**2.23** මෙම සියලු ගැටලු සහ ප්‍රශ්ණ සැලකිල්ලට ගැනීමේදී කාරක සභාවේ අදහස වන්නේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ව්‍යවස්ථාදායකය, රජය සහ විෂයභාර අධ්‍යාපන බලධාරීන් විසින් පහත දැක්වෙන නිර්දේශ සලකා බලමින් රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු බවයි. ප්‍රාථමික හා ද්විතීයික අංශවල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මෙය බෙහෙවින් වැදගත් වේ.

(i) රටේ සියලුම දරුවන්ට මුල් ළමාවිය සහ ළදරු පාසල් අධ්‍යාපනය හඳුන්වා දීමට සුදුසු ප්‍රතිපත්තියක් රජය විසින් අනුගමනය කළ යුතුය. නීති හෝ රෙගුලාසි මගින් එවැනි ප්‍රතිතිපත්තියක් රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම යෝග්‍ය වේ.

(ii) ඉහත කී කාර්යය සඳහා ආයතන පිහිටුවීමට සහ ඒවා පුළුල් කිරීමට රජය විසින් පෞද්ගලික අංශය දිරිමත් කළ යුතු අතර, එම අධ්‍යාපනය සඳහා සියලු දරුවන්ට සමාන ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයිය යුතුය.

(iii) රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම ළමුන් වෙන් වෙන් වශයෙන් සැලකීමකින් තොරව සමාන අධ්‍යාපනයක් ලබන බව තහවුරු කිරීම සඳහා දරුවන්ගේ වයස අනුව සුදුසු විෂයමාලාවක් රජය විසින් ඇතුළත් කළ යුතුය.

(iv) විශේෂයෙන් මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා වන ගුරු අධ්‍යාපනය සහ පුහුණුව සඳහා රජය විසින් (මධ්‍යස්ථාන සමඟ) ආයතනයක් පිහිටුවිය යුතුය.

(v) නිසි කළමනාකරණය, අවශ්‍ය යටිතල පහසුකම්, ගුරුවරුන්ගේ සුදුසුකම් සහ මධ්‍යගත දත්ත ගබඩාවක් සහතික කිරීම සඳහා නියාමන රාමුවක් ස්ථාපිත කළ යුතුය.

(vi) ජාතික පාසල් සහ පළාත් පාසල් ලෙස පාසල් වර්ගීකරණය කිරීම නිසා විවිධ ආකාරයෙන් පාසල් වර්ග දෙක අතර බරපතල පරතරයක් නිර්මාණය වී ඇති අතර, එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(h) ව්‍යවස්ථාව ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සමානාත්මතාව උල්ලංඝනය වේ. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ සමානාත්මතාවය ඇතිකිරීම සඳහා රජය විසින් ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය.

(vii) ජනවාර්ගිකත්වය, භාෂාව සහ ආගම යන අනන්‍යතා අනුව පාසල් වර්ගීකරණය කිරීම ප්‍රජාවන් අතර දුරස්ථභාවයක් නිර්මාණය කරමින් සමාජය අසමඟිය සහ අවිශ්වාසය වෙත රැගෙන යනු ඇත. යටත් විජිත පාලකයන්ගේ කාලයේ පටන් සමාජයේ බොහෝ පාර්ශවයන් තුල ගැඹුරින් මුල් බැසගත් සංස්කෘතියක් පැවති බැවින්, පද්ධතිය තුළ රැඩිකල් ප්‍රතිසංස්කරණයක් සිදු වන විට බොහෝ බාධක සහ ප්‍රතිරෝධයන් ඇති විය හැකි නමුත්, සෑමට අධ්‍යාපනයේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳව සෑම ස්ථරයකම ජනතාව දැනුවත් කිරීම මගින් මෙම ගැටලුව ක්‍රමානුකූල ලෙස විසඳමට අප නිර්දේශ කරන්නෙමු.

(viii) සෑම කලාපයකම අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ පළාත් සභාවල වගකිවයුතු කොටස්කරුවන් සහිත ඒකාබද්ධ කමිටුවක් සෑම පළාතකම පිහිටුවීම සහ පොකුරු පාසල් පිහිටුවමින් ප්‍රාථමික පාසල් විසින් 1 ශ්‍රේණියේ සිට 7/8 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලබා දීමේ වගකීම (පෝෂක පාසැල්) භාර ගැනීම සහ 7 /8 ශ්‍රේණි වල සිට අ.පො.ස (උසස් පෙළ) දක්වා අධ්‍යාපනයේ වගකීම භාර ගැනීම සඳහා ද්විතීයික පාසැල් (මධ්‍ය විද්‍යාල) ස්ථාපිත කිරීම.

(ix) රාජ්‍ය අංශයේ පාසල්වල මධ්‍යගත ගුරු සේවයක් ස්ථාපිත කිරීම සහ ඔවුන් පුහුණු කිරීමේ ඒකමතිකභාවයක් ඇති කිරීම.

(x) කට පාඩම් කරමින් ඉගෙන ගන්නා අධ්‍යාපන ක්‍රමය වෙනුවට සිසුන්ගේ බුද්ධිය සහ ප්‍රඥාව ඉහළ නංවන අතරම ප්‍රජාතන්ත්‍රවාදී සහ සංස්කෘතික සම්මතයන් සහ වටිනාකම් ඇතුළත් නවීන අධ්‍යාපන ක්‍රමවේද සහ විෂයමාලා හඳුන්වා දීම.

(xi) තාක්ෂණ හා විද්‍යා ක්ෂේත්‍රයන්හි නවීන ප්‍රවණතාවන්ට නිසි පිළිගැනීමක් තිබිය යුතු අතර රැකියා අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ඒවාට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

(xii) දරාගත නොහැකි ඉගෙනුම් ද්‍රව්‍යවලින් සිසුන් හට බරක් ඇති නොවන බවට සහතික කිරීම සහ සිසුන්ගේ වයස අනුව මෘදු කුසලතා හඳුන්වා දීම කෙරෙහි ඉගෙනුම් කේන්ද්‍ර ගත කිරීම.

(xiii) පාසල් පාදක ඇගැයීම් මත 50% සහ විභාග පාදක සමත්වීම මත 50% මිශ්‍ර ලකුණු ක්‍රමයක් අනුගමනය කරමින් විෂයමාලා සරල කිරීම. (එක්සත් රාජධානියේ ක්‍රමය විභාග මත පදනම් වන අතර ඇමරිකා එක්සත් ජනපද ක්‍රමය පාසල් ඇගයීම් මත පදනම් වේ.) මිශ්‍ර ක්‍රමයක් අනුගමනය කිරීම අපි නිර්දේශ කරන්නෙමු.

(xiv) 10 වැනි ශ්‍රේණියේදී අ.පො.ස. සා/පෙළ විභාගයට සහ 12 වැනි ශ්‍රේණියේදී අ.පො.ස. උ/පෙළ විභාගයට මුහුණ දීමට තරම් සිසුන් පරිණත වී ඇති බැවින් ඔවුන් ඒ සඳහා සූදානම් කරවීම සහ වසරක් යනු එවන් වයසේ තරුණයන්ගේ ජීවිත වල තීරණාත්මක කාලයක් වන බැවින් නැවත නිර්වචනය කරන ලද සහ නැවත සකස් කරන ලද විෂය මාලා සහිතව ඔවුන් උසස් අධ්‍යාපනයට ඇතුළත් කර ගැනීම.

(xv) ලියාපදිංචිය, සම්පත් යොමු කිරීම, යටිතල පහසුකම්, හැකියාවන්, ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්, සමාජ වගකීම් යනාදී අංග ඇතුළත් වන පරිදි සියලුම පෞද්ගලික පාසල් අධීක්ෂණය කිරීමට රජය විසින් නීති සම්පාදනය කළ යුතුය.

(xvi) තාක්ෂණික හා විද්‍යා ක්ෂේත්‍රයන්හි නවීන ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ දැනට පවතින ක්‍රමවේද සහ විෂයමාලා ප්‍රතිසංස්කරණය කිරීම.

(xvii) රජයේ සහ පෞද්ගලික පාසල් යන දෙවර්ගයෙහිම කිසිදු වෙනසක් හෝ විශේෂයක් නොමැතිව අනිවාර්ය විෂයයන් සඳහා ප්‍රමිතිගත විෂය මාලාවක් තිබිය යුතුය.

(xviii) බොහෝ දුරට විෂයමාලා සහ විෂය නිර්දේශවලට පරිබාහිර ප්‍රශ්න වැළැක්වීම සඳහා විෂයමාලා සකසන්නන් සහ විභාග ප්‍රශ්න පත්‍ර සකසන්නන් අතර සම්බන්ධීකරණ පද්ධතියක් සැකසීම.

(xix) භාෂා විෂයයන් අදාළ භාෂාවේ සාහිත්‍යය සමඟ අන්තර් සම්බන්ධ කළ යුතුය.

(xx) ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම අවධාරණය කරන අතර ජාතික භාෂා දෙකම ඉගෙන ගැනීමට සියලුම සිසුන්ට සමාන අවස්ථා ලබා දීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

(xxi) ද්විතීයික අධ්‍යාපනය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තියට රජයේ මෙන්ම පෞද්ගලික පාසල්වල වෘත්තීය තාක්ෂණ අධ්‍යාපනය සහ පුහුණු කිරීම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම අරමුණු කරගත් විෂයමාලා ඇතුළත් විය යුතුය.

(xxii) සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීමේ අරමුණින් ශාරීරික හා විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා සිසුන් දිරිමත් කිරීම සහතික කිරීම.

(xxiii) සිසුන් අතර පවතින අසාධාරණ තරඟකාරිත්වය සහ සිසුන් පෞද්ගලික උපකාරක පන්ති මත යැපීම දිගු කාලීනව සිසුන් තුල මානසික අවපීඩනය ඇතිවීම ඇතුලු සමාජීය ගැටලු වලට මඟ පාදන බැවින් ක්‍රමිකව ඔවුන් ඉන් ගලවා ගනිමින් නිදහස් හා සාමකාමී මානසිකත්වයකින් අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය කරනු ලබන පරිසරය ඔවුන් හට සලසා දීම අවශ්‍යය. තෘතීයික අධ්‍යාපනය සඳහා ඇති සීමිත අවස්ථාවන් හේතුවෙන් සිසුන්ට දැනට එවැනි තරඟයක නිරත වීම අනිවාර්ය වී ඇති අතර, මෙම අවස්ථා පුළුල් වීමත් සමග එවැනි තරඟකාරිත්වයක් තවදුරටත් නොපවතිනු ඇත.

(xxiv) සිසුන්ට තම වටිනා කාලය අපතේ නොයවා උසස් අධ්‍යාපනයේ නිරත වීමට හැකි වන පරිදි අ .පො.ස. උසස් පෙළ ප්‍රතිඵල සාධාරණ කාලයක් තුළ නිකුත් කරනු ලබන බවට රාජ්‍ය බලධාරීන් විසින් වගබලා ගත යුතුය.

(xxv) රජය විසින් ජාත්‍යන්තර පාසල් ලෙස හඳුන්වනු ලබන සියලුම පෞද්ගලික පාසල් වල ධාරිතාවය, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, විෂයමාලාවන්හි සහ ක්‍රමවේද වල ගුණාත්මක භාවය ඇතුලුව ඒවා ලියාපදිංචි කිරීමේ සහ නියාමනය කිරීමේ ව්‍යවස්ථා සම්පාදනය කළ යුතුය.

# 03 වැනි පරිච්ඡේදය

## උසස් අධ්‍යාපනය

**3.1** දැනට පවත්නා ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන පද්ධති පිළිබඳ විමර්ශනය කිරීමට කාරක සභාව මූලික වශයෙන් තීරණය කළේ ඒවා නෛතික සහ ප්‍රායෝගික වශයෙන් උසස් අධ්‍යාපන පද්ධතියේ පදනම වන බැවිනි. ඒ අනුව, අදාළ පද්ධති පිළිබඳ කාරක සභාව විමර්ශනය කළ අතර ප්‍රතිසංස්කරණ සඳහා වන නිර්දේශ පෙර පරිච්ඡේදයේ දක්වා ඇත.

**3.2** පසුගිය වසර ගණනාව මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ජනගහනය සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇති අතර කලාපයේ ඉහළ සාක්ෂරතා මට්ටමක් පවත්වා ගෙන යාම සඳහා අධ්‍යාපන පද්ධතියේ හරවත් ප්‍රතිසංස්කරණ සිදු කර ඇත. කෙසේ වෙතත්, උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සලකා බැලීමේදී අත් කර ගෙන ඇති ප්‍රගතිය ඉතා අල්පය. ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශය මඟින් උසස් අධ්‍යාපනය ලබා දීම සිදු කරනු ලබයි. සිසුන් බඳවා ගැනීම, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම්, මූල්‍ය ගනුදෙනු සිදු කිරීම් සහ ප්‍රධාන තනතුරු සඳහා පත් කිරීම් සිදු කිරීම යනාදී සියලු ප්‍රතිපත්තිමය තීරණවලට එළැඹීම සම්බන්ධයෙන් වන බලය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත මඟින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත පවරා තිබේ. මූල්‍ය සීමාවන් ඇතුළු වෙනත් අභියෝග හමුවේ රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියට ශ්‍රම වෙළඳපලේ සිදුව ඇති වර්ධනයන් හා සමගාමී වීමට නොහැකි වී තිබේ. සීමිත ප්‍රවේශය, ගුණාත්මකභාවය පිරිහීම සහ අවම අදාළත්වය, දුර්වල පරිපාලනය, කළමනාකරණ ශක්‍යතාවන්ට අදාල කරුණු මෙන්ම සම්පත් ප්‍රමාණවත් නොවීම යනාදී ගැටළු රාශියක් හේතුවෙන් ඊට දැඩි බලපෑම් එල්ල වී ඇත.

**3.3** සුදුසුකම් ලත් සිසුන් හට උසස් අධ්‍යාපන අවස්ථා සැලසීමට රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොවන අංශයේ උසස් අධ්‍යාපන ආයතනවලට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ රටවල උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලැබීමට ඔවුන් උත්සුක වන අතර රටේ විදේශ විනිමය සැලකිය යුතු මට්ටමින් පහත වැටීමට ද එය ප්‍රබල හේතුවක් වී තිබේ. එහෙත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් හට ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි උසස් අධ්‍යාපනය හැදෑරීමට ඇති අවස්ථා අහිමි වී තිබේ.

**3.4** පිරිවැය, තිරසරභාවය සහ සාධාරණ ප්‍රවේශය යනාදී කරුණු සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සමතුලිත වීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික යන දෙඅංශයේම සහභාගීත්වය ඇතිව උසස් අධ්‍යාපන පද්ධතියේ මූල්‍යකරණය සහ කළමනාකරණය සඳහා වන ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණශීලී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. සමාජයේ ප්‍රතිලාභ අවම වශයෙන් හිමි වන කොට්ඨාසය වෙත උසස් අධ්‍යාපනයේ සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම උදෙසා සේවා සම්පාදකයන් වෙත දිරිගැන්වීම් ලබා දීමට මෙන්ම අවම වරප්‍රසාදලත්

සිසුන් හට අමතර සහායක් ලබා දීම ද සිදු කළ යුතුය. විදේශීය පුද්ගලික අධ්‍යාපන ආයතනයක අධ්‍යාපනය හැදෑරීම සඳහා තම දරුවන් යොමු කිරීම බොහෝ මධ්‍යම පාන්තික පවුල්වලට ඉසිලිය නොහැක්කකි. මෙම තත්ත්වය පරිභෝජන රටාව සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එල්ල කරන බලපෑම අතිමහත්ය. විදේශීය පෞද්ගලික අධ්‍යාපන ආයතනයක ගාස්තු ලෙස සමුච්චිත මුදල් පිටතට ගලා යාම සාර්ව ආර්ථිකය කෙරෙහි දරුණු බලපෑමක් එල්ල කළ හැකිය. ආසියානු සංවර්ධන බැංකුවට අනුව (2020) දේශීය විශ්ව විද්‍යාල මඟින් සිදු කරනු ලබන පර්යේෂණවල ප්‍රතිඵල ජාතික අවශ්‍යතාවන් හා සසඳා බැලීමේදී ගුණාත්මකභාවය සහ අදාළත්වය අතින් අවම මට්ටමක පවතී. විශ්ව විද්‍යාල හා කාර්මාන්ත අතර සහයෝගීත්වයෙන් යුතුව පර්යේෂණ සිදු කිරීම ද ඉතා අවම මටට්මක පවතී. තව ද වසරකදී රාජ්‍ය උපාධි ආයතනවලින් බිහි වන ආචාර්ය උපාධිධාරීන්ගේ සාමාන්‍ය අගය 250 ක් පමණ වන අතර ඉන් 92% ක්ම අයත් වන්නේ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයටය. 2012–2013 ගෝලීය තරඟකාරීත්ව දර්ශකයේ ශ්‍රී ලංකාවට නවෝත්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වශයෙන් ඉහළ ස්ථානයක් හිමිව තිබුණ ද (ආර්ථිකයන් 144 ක් අතරින් 58 වැනි ස්ථානය) නවෝත්පාදනයට අදාල වෙනත් දර්ශකවල පහළ ස්ථානයක් හිමිව තිබුණි. 2012 වසරේදී දර්ශක ගණනාවක් අතින් වෙනත් දකුණු ආසියානු රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව මනා කාර්යසාධනයක් පෙන්නුම් කර තිබුණ ද දැනුම් ආර්ථික දර්ශකයේදී නැගෙනහිර ආසියාවේ සහ ශාන්තිකර කලාපයේ රටවල කාර්යසාධනය අභිබවා යාමට ශ්‍රී ලංකාවට නොහැකි විය.

**3.5** දේශාන්තර ආයතන ශ්‍රී ලංකාවේදී විදේශ උපාධි ලබා ගැනීමට අවස්ථාව සලසන පාඨමාලා හඳුන්වා දී තිබේ. වර්තමානයේ වෘත්තීය, ඩිප්ලෝමා, උපාධි අපේක්ෂක සහ උපාධිධාරී මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා සලසන එවැනි ආයතන රැසක් දැකගත හැකිය. ඒවා සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ මැදිහත් වීමකින් තොරව ස්වාධීන ආයතන ලෙස ක්‍රියාත්මක වෙයි. සෙසු ආයතන විදේශීය විශ්ව විද්‍යාලවල අනුබද්ධ දේශීය ආයතන ලෙස සිය කටයුතු සිදු කරන ආකාරය දක්නට හැකිය.

**3.6** රාජ්‍ය විශ්ව විද්‍යාලවලට සිය කාර්යයන්, බලතල, කටයුතු සහ වගකීම් ස්වාධීනව සිදු කිරීමට මෙන්ම සිය ස්වාධීනත්වය පවත්වා ගෙන යාමට හැකි වන පරිදි විශ්ව විද්‍යාල පරිවර්තනය කිරීමේ අරමුණින් සම්මත කළ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ ප්‍රතිපාදන පිළිබඳව කාරක සභාව විමසා බැලීය. ආයතනික ස්වාධීනත්වයට අදාල සහ රාජ්‍ය විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් හට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක මෙන්ම මනා පිළිගැනීමක් ඇති අධ්‍යාපනික සුදුසුකමක් හිමි වීම සහතික කරන ප්‍රගතිශීලී ප්‍රතිපාදන රාශියක් එම පනතේ ඇතුළත් වෙයි.

### 3.7 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම නමින් කොමිසමක් ස්ථාපනය කරන බවත්, පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව ජනාධිපතිතුමා පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් එය සමන්විත වන බවත් පනතේ සඳහන් වෙයි. මෙම කොමිසම ස්ථාපනය කිරීමේ අරමුණු 03 වැනි වගන්තියේ දක්වා ඇති අතර එය මතු කියැවෙන පරිදි වේ;

**(3)** වැනි වගන්තිය -

*"කොමිසමේ අරමුණු මතු කියැවෙන පරිදි වේ -*

*(1) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව විශ්ව විද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය*

*(2) විශ්ව විද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුවෙන් අනුමත කළ අරමුදල් උසස් අධ්‍යාපන ආයතන සඳහා වෙන් කිරීම සහ එක් එක් උසස් අධ්‍යාපන ආයතන මඟින් සිදු කරනු ලබන වියදම් පාලනය කිරීම*

*(3)උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගෙන යාම*

*(4) උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය නියාමනය කිරීම*

*(5) එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුලත් කිරීම නියාමනය; සහ*

*(6) මෙම පනත යටතේ ප්‍රදානය කර ඇති හෝ පනවා ඇති හෝ කොමිසමට පවරා ඇති එවැනි බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කාර්ය සාධනය සහ ඉටු කිරීම."*

**3.8** උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් සිය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පනතේ 15 වැනි වගන්තිය මඟින් කොමිසමට බලය හිමි වන අතර කොමිසමේ අධීක්ෂණයට අයත් වන එක් එක් උසස් අධ්‍යාපන ආයතනවල පාලනාධිකාරිය හා සම්බන්ධ වෙමින් එම කටයුතු සිදු කළ හැකිය.

**3.9** පනතේ 18 වැනි වගන්තියේ සඳහන් කර ඇති පරිදි සිය බලතල, කාර්යය හා කර්තව්‍ය විධිමත්ව ඉටු කිරීම සඳහා පනත යටතේ අවශ්‍ය ආඥාපනත් සකස් කිරීම සඳහා කොමිසමට බලය හිමි වේ. කොමිසම වෙත එලෙස පැවරී ඇති බලතල 18(2) වගන්තියේ දක්වා ඇති අතර එය මතු කියැවෙන පරිදි වේ;

**3.10** 18(2) වගන්තියේ මතු කියැවෙන පරිදි සඳහන් වෙයි;

*"(අ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වන සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියමාවලි සාදනු ලැබිය හැකිය ;*

*(ආ) කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි;*

*(ඇ) කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්යය මණ්ඩලයට බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීමේ ක්‍රම;*

*(ඈ) උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා විශ්ව විද්‍යාවල අධ්‍යයන තත්ත්වයන් ඇති කිරීම හා පවත්වාගෙන යාම;*

*(ඉ) උසස් අධ්‍යාපන ආයතනවල හා ඒ අවට පහසුකම් සම්බන්ධීකරණය;*

*(ඊ) විශ්ව විද්‍යාලවලින් සැපයිය හැකි හා සංවිධාන කළ හැකි ව්‍යාප්ති සේවාවල ස්වභාවය හා සීමාව;*

*(එ) විදේශීය උපාධි හා අභිඥාන පත්‍ර ද වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිගැනීම; සහ*

*(ඒ) මෙහි මින් ඉහත සඳහන් කරන ලද කාරණා අතුරින් යම් කාරණයකට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ වෙනත් යම් කාරණයක්.''*

**3.11** පනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව බලතල හා කාර්යයන් සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලවලට සහ පරිපාලනයට පොදු නියෝග නිකුත් කිරීමේ වගකීම විෂයය භාර අමාත්‍යවරයාට පැවරෙන බව සඳහන් කළ මනාය.

**3.12 20(1) වගන්තියේ සිට (5) දක්වා මතු කියැවෙන පරිදි සඳහන් කර ඇත;**

*(1) (අ) විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය සම්බන්ධයෙන් හා මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු වගකීම ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකි වන පරිදි. මුදල්, විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන් සඳහා වෙන් කරනු ලබන ස්ථාන සංඛ්‍යාව හා ඉගැන්වීමේ මාධ්‍යය යනාදී කාරණා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය යයි ඔහු සලකන සාමාන්‍ය ලිඛිත විධාන කොමිෂන් සභාවට කලින් කල නිකුත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි වේ. ඒ සෑම විධානයක්ම හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතුය.*

*(ආ) කොමිෂන් සභාව ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු අතර ඒ විධාන අනුව කොමිෂන් සභාව විසින් ක්‍රියා කළ හැකි වන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු කොමිෂන් සභාවට හෝ එහි සාමාජිකයෙකුට හෝ නිලධරයෙකුට හෝ ලබා දීම හා සැපයීම උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් කළ යුතුය.*

*(2)(අ) විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය සම්බන්ධයෙන් හා මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු වගකීම ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකි වන පරිදි යම් උසස් අධ්‍යාපන ආයතනයක කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් හෝ එහි පරිපාලනය විමර්ශනය කොට වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට කලින් කල නියම කළ හැකිය.*

*(ආ) කොමිෂන් සභාව විසින් ඒ නියමය අනුව ක්‍රියා කළ යුතු අතර ඒ නියමය අනුව කොමිෂන් සභාව විසින් ක්‍රියා කළ හැකි වන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු කොමිෂන් සභාවට හෝ එහි සාමාජිකයෙකුට හෝ නිලධරයෙකුට ලබා දීම හා*

*සැපයීම ඒ නියමය අදාළ වන උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් කළ යුතුය.*

*(ඇ) (අ) ඡේදය යටතේ කරන ලද නියෝගයකට අනුකූලව කොමිෂන් සභාව විසින් වාර්තාවක් ලැබීමෙන් පසු, අමාත්‍යවරයා විසින් කිසියම් කටයුත්තක් හෝ ඉහළ පරිපාලනයක් සම්බන්ධයෙන් අවශ්‍ය යැයි සලකන ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට නියෝග කළ හැකිය.*

*(3) උසස් අධ්‍යාපන ආයතනයක පවත්නා තත්ත්වය රාජ්‍ය ආරක්ෂාවට අනතුරුදායක හෝ ජාතික ප්‍රතිපත්තියට පටහැණි හෝ හානිකර හෝ බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක,*
*ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන සියලු පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කළ හැකිය.*

*(4) යම් වර්ජනයක් හෝ පිටමං කිරීමක් හෝ වෙන යම් හේතුවක් නිසා උසස් අධ්‍යාපන ආයතනයක වැඩ කටයුතු හෝ පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ කටයුතු හා පරිපාලනය යථා තත්ත්වයට පත් කිරීමට ඒ උසස් අධ්‍යාපන ආයතනයේ බලමණ්ඩල අපොහොසත් වී ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ උසස් අධ්‍යාපන ආයතනයෙහි කටයුතු යථා තත්ත්වයට පත් කරනු පිණිස අවශ්‍ය වන සියලු ක්‍රියාමාර්ග අමාත්‍යවරයා විසින් ගත හැකිය. යථා තත්ත්වයට පත් කරන තුරු අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින් ඒ උසස් අධ්‍යාපන ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් පිළිබඳව අවශ්‍ය යැයි ඔහු සලකන සියලු විධිවිධාන සැලැස්විය හැකිය;*
*ඒ උසස් අධ්‍යාපන ආයතනය වසා දැමීම;*

*(අ) ඒ උසස් අධ්‍යාපන ආයතනයේ යම් නිලධරයෙකු, බල මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් වෙනුවට, මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් හෝ යටතේ වූ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා නිසි බලධරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කිරීම; සහ*

*(ආ)ඉහත කී කාරණාවලට සම්බන්ධ වූ හෝ අදාළ වූ යම් කාරණයක්.*

*(5) අමාත්‍යවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් එහි සඳහන් දිනයක ක්‍රියාත්මක වන්නේය. ඉන් පසු හැකිතාක් ඉක්මනින් එකී නියමය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු අතර කලින් පරිච්ඡින්න කරනු ලැබුවහොත් මිස, එය ඉන් පසු මාස තුනක් නොඉක්මවන කාලයක් වලංගුව පවත්නේය.''*

**3.13** මතු කියැවෙන පරිදි විවිධ අධ්‍යාපනික ආයතනවලට පනත අදාළ වේ;

(i) විශ්ව විද්‍යාල, මණ්ඩප හා විශ්ව විද්‍යාලයීය විද්‍යායතන පිහිටුවීම (21 වැනි වගන්තිය)

(ii) විශ්ව විද්‍යාල, මණ්ඩප හා විශ්ව විද්‍යාලයීය පීඨ පිහිටුවීම (22 වැනි වගන්තිය)

(iii) විවෘත විශ්ව විද්‍යාලයක් පිහිටුවීම (23 වැනි වගන්තිය)

(iv) විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයක් පිහිටුවීම (24 වැනි වගන්තිය)

(v) වැඩිදුර අධ්‍යාපනය සඳහා ආයතන හෝ මධ්‍යස්ථාන පිහිටුවීම (24(අ) වගන්තිය)

(vi) වැඩිදුර අධ්‍යාපනය සඳහා ආයතනයක් හෝ විද්‍යායතනයක් ලෙස පිළිගැනීම (24(ආ) වගන්තිය)

(vii) අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා සැපයීම සඳහා පවත්නා ආයතන පිළිගැනීම (25 වැනි වගන්තිය)

(viii) උපාධි ප්‍රදානය කරන ආයතනයක් පිළිගැනීම (25 (අ) වගන්තිය)

(පනතට අදාළව සහ කලින් කලට ඊට එක් කළ සංශෝධනවලට අදාලව ඉහත යොමු සිදු කර ඇත.)

**3.14** විධායක බලතල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාලයකට බලමණ්ඩලයක් තිබිය යුතු බවත් 44 වැනි වගන්තිය ප්‍රකාරව එය විශ්වවිද්‍යාල පාලනාධිකාරිය ලෙස සැලකිය යුතු බවටත් පනත මඟින් දක්වා ඇත. ඊට අමතරව 45 වැනි වගන්තිය මඟින් බලමණ්ඩලයේ නිශ්චිත බලතල, කර්තව්‍ය සහ කාර්යයන් සඳහන් කර තිබේ.

**3.15** 46 වගන්තියේ දක්වා ඇති පරිදි සෑම විශ්ව විද්‍යාලයකටම අධ්‍යයන කටයුතු සඳහා වගකියන සෙනෙට් සභාවක් තිබිය යුතුය. පනත යටතේ පිහිටුවා ඇති මණ්ඩපයකට 47 වැනි වගන්තියේ සඳහන් නිලධාරීන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් තිබිය යුතුය. පනතේ 48 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාල පීඨ සහ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ප්‍රතිපාදන ඇත. පනතේ 55 වැනි වගන්තියට අනුව විශ්වවිද්‍යාල විද්‍යායතන ක්‍රියාත්මක කිරීමට ද විධිවිධාන සලසා ඇත. මෙම පනත 2016 වසර තෙක් හත් වතාවක් සංශෝධනය කර ඇත.


ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පනතට තවත් සංශෝධන සිදු කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටින බව අප සමඟ කළ සාකච්ඡාවේ දී අනාවරණ විය.

**3.16** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වැඩිදුරටත් සඳහන් කළේ උසස් අධ්‍යාපන හෝ පර්යේෂණ සහ විද්‍යාත්මක මෙන්ම තාක්ෂණික ආයතන සඳහා ආයතනවල ප්‍රමිතීන් සම්බන්ධීකරණය සහ නිර්ණය කිරීම මෙන්ම උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතික කිරීමට සහ ප්‍රතීතනය සඳහා නීතිමය රාමුවක් හඳුන්වා දීමේ ජාතික ප්‍රතිපත්තිය හා සමගාමී වෙමින් උසස් අධ්‍යාපනය සඳහා තත්ත්ව සහතික සහ ප්‍රතීතනය නමින් හැඳින්වෙන කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා 2019.06.17 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික කිරීම සහ

ප්‍රතීතනය)" නමින් පනත් කෙටුම්පතක් ගැසට් කර ඇති බවයි. එහෙත් එය ඉදිරියට ක්‍රියාත්මක වී නොමැත.

**3.17** කාරක සභාව විසින් දැනට පවත්නා උසස් අධ්‍යාපන ව්‍යුහය විමසා බැලූ අතර එහිදී පද්ධතියේ සමපාත නොවන ස්වභාවය හඳුනා ගන්නා ලදී. පවත්නා ක්‍රමය පහත පරිදි සාරාංශගත කළ හැක;

*රූපය 1:ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අසමමිතික ස්වභාවය*




**(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පාලනය කරනු ලබන රජයේ විශ්ව විද්‍යාල**

**(අ) රජයේ විශ්ව විද්‍යාල 16**

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපිත කරන ලද පරිදි රාජ්‍ය අංශය තුළ ස්වාධීන උසස් අධ්‍යාපන ආයතන වශයෙන් ක්‍රියාත්මක වන විශ්ව විද්‍යාල 16 ක් ඇත.

රජයේ විශ්වවිද්‍යාල වල ආයතනික ව්‍යුහය පීඨ සහ දෙපාර්තමේන්තු වලින් සමන්විත වේ. එයට අමතරව උසස් අධ්‍යාපනය සඳහා මණ්ඩප (campus), විශ්ව විද්‍යාල ආයතන (university college), වෙනත් අධ්‍යාපන ආයතන හෝ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා පනත මගින් ඉඩකඩ සැලසෙනු ලැබේ. උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන පිළිගැනීමට ලක් කිරීමේ බලතල අමාත්‍යවරයා වෙත ලබා දීම සඳහා 1995 වර්ෂයේදී ද මෙම පනත සංශෝධනය කරන ලදී.

**(ආ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලද්දේ වැඩිහිටි අධ්‍යාපනයේ වැදගත්කම ආමන්ත්‍රණය කරමින් විශේෂයෙන් වැඩ කරන ජනතාව උදෙසාය.

කෙසේ වුවද, කාලයත් සමඟ රජයේ විශ්වවිද්‍යාල හා සමාන මට්ටමට මෙය පෙළගැස්වී ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ සම්පාදිත ආඥා පනතක් මගින් මෙය පාලනය වේ.

**(ii) පාර්ලිමේන්තුවේ විවිධ ව්‍යවස්ථා යටතේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල පහකි.**

මීළඟට ඉදිරිපත් කරන විශ්වවිද්‍යාල කාණ්ඩය සඳහා ආයතන පහක් ඇතුලත් වන අතර ඒවා වෙනම පනත් යටතේ ස්ථාපිත කොට ඇති බැවින් ඒවා අධ්‍යාපන අමාත්‍යාංශ විෂයපථය යටතට නොගැනේ.

*වගු අංක 1: විවිධ ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල*

| | විශ්ව විද්‍යාලය | පාලනය කරනු ලබන්නේ |
|---|---|---|
| 1 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) | ආරක්ෂක අමාත්‍යාංශය |
| 2 | ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය | *අධ්‍යාපන අමාත්‍යාංශයේ කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය* |
| 3 | ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය | *අධ්‍යාපන අමාත්‍යාංශය* |
| 4 | ශ්‍රී ලංකා බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලය | *අධ්‍යාපන අමාත්‍යාංශය* |
| 5 | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | *අධ්‍යාපන අමාත්‍යාංශයේ කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන අංශය* |

අ) ඉහත සඳහන් විශ්වවිද්‍යාල විවිධ ක්ෂේත්‍ර සහ විෂයයන් යටතේ විශේෂඥභාවයකින් කටයුතු කරනු ලැබුවද, ඒවා සඳහා එක සමාන ආකාරයකින් සලකනු ලැබීමත් එකම කාණ්ඩයක් යටතට ගෙන ඒමත් අවශ්‍ය වන බව කාරක සභාවේ මතය වේ.

ආ) ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) ස්ථාපිත කරන ලද්දේ ආරක්ෂක ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය සහ පුහුණුව සැපයීමේ විශේෂ අරමුණ උදෙසාය. මෙය සිදු කරන ලද්දේ ආරක්ෂක අධ්‍යාපන ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා ඉඩම පරිත්‍යාග කරන ලද දායකයාගේ අපේක්ෂාවන් සැලකිල්ලට ගනිමිනි.

ඇ) භික්ෂු විශ්ව විද්‍යාලය සහ පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලය ස්ථාපිත කරන ලද්දේ බෞද්ධ දර්ශනයට අනුව බෞද්ධ භික්ෂූන්ට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීමේ සහ බෞද්ධ ඉගැන්වීම් ව්‍යාප්ත කිරීමේ අභිමතාර්ථය සහිතවයි. එහෙත් පෙනී යන ආකාරයට එවන් අභිමතාර්ථයකින් මෙම විශ්ව විද්‍යාල කටයුතු කරන බවක් නොපෙනෙන අතර ඒ වෙනුවට එම ආයතන ස්ථාපිත කිරීම පිටුපස ඇති මූලික අරමුණු නොසලකා හරිමින් වෙනත් විශ්ව විද්‍යාල හා සමානව ක්‍රියාත්මක වීම දැක

ගත හැකිය. බෞද්ධ විශ්ව විද්‍යාල සහ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා සහ අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහා සාකච්ඡා සිදු කිරීම වැදගත් වේ.

ඇ) ඓතිහාසික වශයෙන් සැලකූ කල, වෘත්තීය උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා රජය විසින් ලබා දුන් අවධානය සෑහීමකට පත් විය හැකි ආකාරයේ එකක් නොවන බව සඳහන් කිරීම අවශ්‍ය වේ. මෙය, උසස් අධ්‍යාපනය සඳහා වඩා වැඩි අවස්ථා ප්‍රමාණයක් පුළුල් කළ හැකි ක්ෂේත්‍රයක් පමණක් නොව වෘත්තීයමයභාවය සඳහා වඩා වැඩි අවස්ථා නිර්මාණය කළ හැකි ක්ෂේත්‍රයක් ද වේ.

**(iii) අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ස්ථාපිත කරනු ලබන රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන.**

අ) වර්තමානය වන විට උපාධි ප්‍රදානය කරනු ලබන මට්ටමේ ආයතන වශයෙන් හඳුනාගැනීමට ලක්ව ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 24ක් පවතී. කිසියම් ආයතනයක් උපාධි ප්‍රදානය කිරීමේ මට්ටමේ ආයතනයක් වශයෙන් සුදුසු තත්ත්වයේ ලා හඳුනාගැනීමට අමාත්‍යවරයාට බලතල ලබා දීම උදෙසා 1998 අංක 24 දරණ සංශෝධන පනත මගින් මූලික පනත සඳහා 25(අ) සහ 70(ඇ) යන කොටස් හඳුන්වා දී ඇති බව පෙනෙන්නට තිබේ.
(රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 24ක ලැයිස්තුව X2 වශයෙන් සලකුණු කොට අමුණා ඇත.)


ආ) අධ්‍යාපන අමාත්‍යාංශය / උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දෙන අනුමැතියට යටත්ව පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ස්ථාපිත කරනු ලැබේ. කෙසේ වුවද, පාඨමාලා අනුමත කිරීම, උපාධි හෝ වෙනත් සුදුසුකම් ප්‍රදානය කිරීම යනාදිය සඳහා තත්කාර්ය පරිපාලන පිළිවෙත් ක්‍රියාත්මක කොට ඇත. උපාධි ප්‍රදානය කිරීම, තත්ව ගුණාත්මක භාවය සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා අවශ්‍ය වන අවම කොන්දේසි සහ අවශ්‍යතාවයන් වලට අනුකූල වන බවට සහතික කිරීමට මෙම උසස් අධ්‍යාපන ආයතන අපොහොසත් වී ඇති බැවින් මෙම යාන්ත්‍රණය කාර්යක්ෂම නොවේ. දෙමාපියන් විසින් ස්වකීය දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වලට ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරනු ලබන නමුත් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් සුරැකිතාවයන් ක්‍රියාත්මක කිරීමට රජය අපොහොසත් වී ඇත.

ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය මගින් සපයනු ලබන සංඛ්‍යාලේඛන වලට අනුකූලව, රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ලියාපදිංචි වීම කාලයක් සමග ඉහළ ගොස් ඇත. ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවේ සැලකිය යුතු ඉහළ යාමක් පහත දක්වා ඇති වගුව සහ සටහන තුලින් පෙන්නුම් කරනු ලැබේ.

*වගු අංක 2: රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනය සඳහා සිසුන් බඳවා ගැනීම*

| කාණ්ඩය | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හඳුනාගනු ලබන වැඩසටහන් සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි වීම | 8,147 | 8,831 | 12,426 | 16,254 |
| අනුබද්ධ ආයතනවල වැඩසටහන් සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි වීම | 2,300 | 2,497 | 8,060 | 9,935 |

*ප්‍රස්තාරය 1: රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීමේ ප්‍රවණතා*




රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය සඳහා පහසුකම් සැලසීම ඔස්සේ තරුණ තරුණියන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා වඩාත් පුළුල් වන බවට ඉහත රූප සටහන මගින් පෙන්නුම් කරනු ලැබේ.

## (iv) විදේශීය විශ්ව විද්‍යාල / අධ්‍යාපන ආයතන හා අනුබද්ධ ආයතන

විදේශ විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන හා අනුබද්ධිත ව උපාධි සහ අනෙකුත් උසස් අධ්‍යාපන සහතික (පශ්චාත් උපාධිද ඇතුළත්ව) ප්‍රදානය කරනු ලබන ආයතන රැසක් පවතී. කෙසේවුවද මෙම ආයතන වල නියෝජනයේ නිරවද්‍යභාවය සහතික කර ගැනීම සඳහා හරියාකාර යාන්ත්‍රණයක් නොමැති වීමේ ගැටලුව පවතී. නිශ්චිත ආයතන සංඛ්‍යාව, ඒවා පිහිටි ස්ථාන, ඒවායේ සිටින සිසුන් සංඛ්‍යාව සහ ප්‍රදානය කරනු ලබන සහතික පත්‍ර වල ස්වරූපය යනාදිය සඳහා නිසි සැලකිල්ලක් යොමු නොවීම හෝ කිසිදු රජයේ ආයතනයක් මගින් ඒවා නියාමනයට ලක් වීම සිදු නොවේ. මෙම ඇතැම් ආයතන ඉතා දුර්වල ප්‍රමිතීන් සහ තත්ත්වයන් පවත්වා ගෙන යනු ලබන අතර ඒවායින් නිකුත් කරන සහතික වල වලංගුභාවය හෝ පිළිගැනීම පිළිබඳව බොහෝ පුද්ගලයන් තුල නිසි සැලකිල්ලක් නොමැත.

**3.18** විදේශීය සිසුන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ගැලපෙන පරිදි අධ්‍යාපනික වටපිටාව සහ කොන්දේසි යෝග්‍ය ආකාරයෙන් පවත්නා බැවින් ශ්‍රී ලංකාව තුළ උසස් අධ්‍යාපනයෙහි නිරත වීමට විදේශීය සිසුන් සඳහා ද අවස්ථාව ලබා දීමේ හැකියාව ගවේෂණය කිරීමට විශේෂ අවධානයක් රජය විසින් යොමු කිරීම වඩාත් යෝග්‍ය වේ. මෙහිදී සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල් මෙම කලාපයේ උදාහරණ වශයෙන් දැක්විය හැකිය. 2022 වර්ෂයේ මැලේසියාව තුළ විදේශීය සිසුන් 51,000 ක් සිට ඇති බව අනාවරණය වේ. අපගේ දරුවන් දේශීය වශයෙන් මෙන්ම විදේශයන් වලද විදේශීය උසස් අධ්‍යාපන ආයතන වල සිසුන් වශයෙන් ලියාපදිංචි වීම හේතු කොට ගෙන ඉතා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටෙන් පිටතට ඇදී යන බව විද්‍යමාන වේ. අවාසනාවකට, විදේශීය විශ්ව විද්‍යාල හෝ අධ්‍යාපන ආයතන මගින් ප්‍රදානය කරනු ලබන ඇතැම් උපාධි හෝ උසස් අධ්‍යාපන සහතික පත්‍ර අදාළ ක්ෂේත්‍රයන්හි අපේක්ෂිත ප්‍රමිතීන් සපුරාලීමක් සිදු නොකරන බව පෙනී යයි. එවන් ඇතැම් ශිෂ්‍යයින් අභියෝග ගණනාවකට මුහුණ දෙනු ලබන අතර ඇතැම් අවස්ථාවලදී ඛේදනීය ඉරණම් වලටද ලක් වීම සිදු වේ.

රජයේ විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ලියාපදිංචි කරගනු ලබන ක්‍රමය පරීක්ෂාවට ලක් කිරීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අප වෙත ඉදිරිපත් කරන ලද පාසල් සහ උසස් අධ්‍යාපනය ආශ්‍රිත සංඛ්‍යා ලේඛන අප විසින් මෙහි ඉදිරිපත් කරනු ලැබේ.

*වගුව 3 : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඉදිරිපත් කරනු ලබන පාසල් සහ උසස් අධ්‍යාපනය ආශ්‍රිත සංඛ්‍යා දත්ත*

| | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
| 1 ශ්‍රේණිය සඳහා ඇතුලත් වීම් | 322,135 | 328,632 | 333,074 | 319,405 | 304,105 | 312,819 |
| සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සංඛ්‍යාව | 296,812 | 296,029 | 305,427 | 308,134 | 311,321 | 472,553 |
| උසස් පෙළ විභාගයට පෙනී සිටින සංඛ්‍යාව | 263,184 | 253,357 | 267,202 | 290,313 | 311,159 | 283,616 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සංඛ්‍යාව | 160,517 | 163,160 | 167,992 | 181,206 | 194,366 | 171,532 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරනු ලබන සංඛ්‍යාව | 71,110 | 78,905 | 76,608 | 92,695 | 102,788 | 91,249 |
| රජයේ විශ්වවිද්‍යාල සඳහා ඇතුලත් කරනු ලබන සංඛ්‍යාව | 30,662 | 34,415 | 31,881 | 41,641 | 43,927 | 44,000* |

**3.19** ඉහත වගුව මගින් පිළිබිඹු කරන ආකාරයට 2017 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 160,517ක් වී ඇති නමුත් රජයේ විශ්ව විද්‍යාල මගින් ඉඩකඩ සලසන ලද්දේ සිසුන් 30,662 කට පමණි. 2022 වර්ෂයේ සිසුන් 171,532 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන පසුබිමක රජයේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට හැකි වූයේ සිසුන් 44,000ක් පමණි. ඉතිරි සංඛ්‍යාව වන 127,000 කින් රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන හෝ විදේශීය විශ්ව විද්‍යාල සඳහා ඇතුලත් වීමේ අවස්ථාව සලසා ගත හැකි වනු ඇත්තේ සිසුන් 20,000 – 25,000 අතර ප්‍රමාණයකට විය හැකිය. ඒ අනුව පෙනී යන්නේ උසස් අධ්‍යාපන අවස්ථා සපුරා ගැනීමට සුදුසුකම් ලබන සිසුන්ගෙන් අවම වශයෙන් 100,000 ක පමණ ප්‍රමාණයකට පහත ආකාරයේ විවිධ වූ හේතු සාධක නිසාවෙන් එවන් උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වී යන බවයි. (අධ්‍යාපනය හැර යන්නන් වශයෙන් හඳුන්වනු ලබන) ;

අ) උසස් අධ්‍යාපනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැති වීම.

ආ) උසස් අධ්‍යාපනයට මෙන්ම ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන අරමුදල් ප්‍රමාණවත් නොවීම.

ඇ) රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශය ද තුළ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ඉඩකඩ සලසනු ලබන නිසි නෛතික රාමුවක් නොමැති වීම.

ඈ) රැකියා අවස්ථා නොමැතිවීම හේතු කොට ගෙන උසස් අධ්‍යාපනය හැදෑරීමට අභිප්‍රේරණයක් නොමැති වීම.

ඉ) පවත්නා ක්‍රමවේද සහ විෂයමාලාවන් යල් පැන ගොස් තිබීම සහ වර්තමානයේ පවත්නා අවශ්‍යතාවයන් සහ ප්‍රමිතීන්ට ඒවා නොගැලපීම

ඊ) රජයේ විශ්ව විද්‍යාල තුළ අධ්‍යාපනයේ අවිනිශ්චිතභාවය සහ අඛණ්ඩ බාධා වීම්

උ) විවිධ හේතු නිසා රජයේ විශ්ව විද්‍යාල වලින් පිටවන සිසුන් බඳවා ගැනීමට පෞද්ගලික අංශය තුළ පවත්නා පැකිළීම.

ඌ) විශ්ව විද්‍යාල කළමනාකරණය පහළ මට්ටමක පැවතීම.

එ) ඇතැම් රජයේ විශ්ව විද්‍යාලවල කාර්යක්ෂමතාවයක් නොමැති වීම සහ දුර්වල වටපිටාවක් පැවතීම.

ඒ) අවශ්‍ය විනය තත්ත්වයන් නොමැති වීම සැලකිය යුතු තත්වයකි.

**3.20** 2021 වර්ෂයේදී රජයේ විශ්ව විද්‍යාල වලට ලියාපදිංචි වීම ඒ ඒ විෂයයන් අනුව සිදුවන ආකාරය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් සපයනු ලබන සංඛ්‍යාලේඛනද කාරක සභාව විසින් පරීක්ෂා කරන ලදී.

*වගුව 4: 2021 වසරේ රජයේ විශ්ව විද්‍යාල වලට විෂයයන් අනුව ඇතුළත් වීම.*

| පාඨමාලාව | **සිසුන් සංඛ්‍යාව** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| කලා සහ නීතිය | 11,488 | 26.2 |
| කළමනාකරණය සහ වාණිජ | 8,009 | 18.2 |
| විද්‍යාව | 7,441 | 16.9 |
| තාක්ෂණය | 3,565 | 8.1 |
| ඉංජිනේරුවේදය සහ වාස්තු විද්‍යාව | 3,214 | 7.3 |
| පශු වෛද්‍ය විද්‍යාව සහ කෘෂිකර්මය | 3,022 | 6.9 |
| පරිගණක විද්‍යා / තොරතුරු තාක්ෂණය | 2,614 | 6.0 |
| වෛද්‍ය විද්‍යාව සහ දන්ත වෛද්‍ය විද්‍යාව | 2,168 | 4.9 |
| සම සෞඛ්‍ය විද්‍යා | 1,645 | 3.7 |
| දේශීය වෛද්‍ය විද්‍යාව | 761 | 1.7 |

**3.21** උපාධිධාරීන්ගේ සේවා නියුක්ත වීමේ සුදුසු තත්වය නිරූපණය කෙරෙන මෙම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම වැදගත් වේ. (අවසාන ප්‍රතිඵල වලින් පසුව මාස 3ක් ඇතුළත)

*වගුව 5 : උපාධිධාරීන්ගේ සේවා නියුක්තවීමේ සුදුසු තත්වය ආශ්‍රිත සංඛ්‍යා දත්ත*

| ශාස්ත්‍රිය විෂය ධාරාව | සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය (%) |
|---|---|
| වෛද්‍ය විද්‍යාව | 100.0 |
| තොරතුරු තාක්ෂණය | 96.5 |
| ඉංජිනේරුවේදය | 91.0 |
| සම සෞඛ්‍ය විද්‍යා | 74.8 |
| කෘෂිකර්මය | 70 |
| කළමනාකරණය | 70 |
| විද්‍යාව | 70 |
| තාක්ෂණය | 54.1 |
| කලා | 28.5 |


**3.22** අධ්‍යාපන අංශය තුළ ඉහළ මට්ටමකට ගොස් සිටින බොහෝ ශාස්ත්‍රඥයින්, අධ්‍යාපනවේදීන් සහ වෘත්තියවේදින් විසින් කාරක සභාව වෙත දක්වන ලද අදහස වූයේ ලෝකයේ සංවර්ධනය වූ සහ සංවර්ධනය වන රටවල් තුල ආයතන කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් විතැන් වීමක් දැක ගත හැකිබවත් පුද්ගල කේන්ද්‍රීය අධ්‍යාපනය ක්‍රමය කෙරෙහි වඩා වැඩි නැඹුරුවක් පවතින බවත්ය.

**3.23** අදාළ විෂයයන් වලදී සිසුවකු සඳහා වියදම් කරනු ලබන මුදල් ප්‍රමාණයද පහත පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කොට ඇත;

*වගුව 6 : විවිධ උපාධි පාඨමාලාවන්හි උපාධි අපේක්ෂකයෙකු සඳහා වසරකට ඇස්තමේන්තුගත පිරිවැය*

| පීඨය | පාඨමාලාවේ කාලය | සිසුවකු සඳහා වසරකට ඇස්තමේන්තු කරන ලද පිරිවැය (රු.) |
|---|---|---|
| කෘෂිකර්මය | 4 | 686 607 |
| වාස්තු විද්‍යාව | 4/5 | 410 179 |
| කලා / සමාජ විද්‍යාව / මානව විද්‍යා | 3/4 | 352 475 |
| ව්‍යාපාර අධ්‍යයනය | 4 | 283 886 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | 5 | 1 712 039 |
| අධ්‍යාපනය | 4 | 589 853 |
| ඉංජිනේරුවේදය | 4 | 705 231 |
| නීතිය | 4 | 312 460 |
| වෛද්‍ය විද්‍යාව | 5 | 1 010 452 |
| විද්‍යාව | 3/4 | 466 344 |
| පශු වෛද්‍ය විද්‍යාව | 5 | 1 522 988 |
| ජන මාධ්‍ය සහ ප්‍රාසාංගික කලා | 4 | 520 393 |
| භූදත්ත විද්‍යාව | 4 | 513 267 |
| පශු සම්පත් සහ පෝෂණ විද්‍යාව | 4 | 588 524 |
| තොරතුරු තාක්ෂණය | 4 | 362 994 |
| මත්ස්‍ය සහ සමුද්‍රීය විද්‍යා හා තාක්ෂණය | 4 | 704 771 |
| ඉස්ලාම් අධ්‍යයන | 3/4 | 235 328 |
| සම සෞඛ්‍ය විද්‍යා | 4 | 720 252 |
| තාක්ෂණය | 4 | 369 879 |

*ප්‍රස්තාරය 2: විවිධ උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයෙකු සඳහා වසරකට ඇස්තමේන්තුගත පිරිවැය*



**3.24** අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙන් කර ඇති ප්‍රතිශතය දළ වශයෙන් ප්‍රමාණවත් නොවන බව අවධාරණය කරන ලද අතර පහත සඳහන් සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන ලදී.

*වගු අංක 7: මෑත වසරවල අධ්‍යාපනය සඳහා වෙන් කිරීම දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස*

| වර්ෂය | දළ දේශීය නිෂ්පාදිතයෙන් % ලෙස |
|---|---|
| 2015 | 2.0 |
| 2016 | 2.0 |
| 2017 | 1.9 |
| 2018 | 1.9 |
| 2019 | 1.9 |
| 2020 | 1.9 |
| 2021 | 1.8 |
| 2022 | 1.5 |

සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ආරක්‍ෂාව විෂයය යටතේ වන බැවින් මෙහි පිළිබිඹු නොවන බව නිරීක්ෂණය කළ හැක.

**3.25 රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අදාළ ගැටළු**

අ) නූතන අවශ්‍යතා සමඟ සමපාත වන, නිසි හා ගැලපෙන උසස් අධ්‍යාපනය පාඨමාලා නොමැතිකම රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් අධ්‍යාපනය සම්පූර්ණ කර පිටව යන උපාධිධාරීන්ට රැකියා අවස්ථා නොලැබීමට සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත. මෙම තත්ත්වය ද රාජ්‍ය විශ්ව විද්‍යාල වල දියුණුව, ගුණාත්මකභාවය, ප්‍රමිතීන් සහ ප්‍රතීතනයට අහිතකර ලෙස බලපායි.

ආ) රාජ්‍ය විශ්වවිද්‍යාලවල පවතින දුර්වලතා සහ අඩුපාඩු පිළිබඳව සවිස්තරාත්මකව විමසීමට අප අදහස් නොකළ ද, බැරෑරුම් ලෙස සලකා බැලිය යුතු ඇතැම් කරුණු මෙහි සඳහන් කර තිබේ;

(i) සම්පත් ඌන උපයෝජනය, උදාහරණයක් ලෙස, විවිධ පීඨ සඳහා දේශන ශාලා වෙනම වෙන් කර තිබීම සහ ඒවා පැය කිහිපයක් පමණක් භාවිතා කරනු ලැබීම. වෙනත් රටවල විශ්ව විද්‍යාල පීඨ සහ දෙපාර්තමේන්තු අතර මෙම පහසුකම් බෙදාගැනීමෙන් ඒවා උපරිම ලෙස භාවිතා කරයි.

(ii) බලධාරීන් විසින් නොයෙකුත් ප්‍රයත්න දැරුවද, පාඨමාලා සහ විෂයමාලා දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නැත.

(iii) අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 16,000 ක් පමණ ද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 9,000 ක් පමණ ද සිටින බැවින් ද අනෙකුත් රටවල විශ්ව විද්‍යාලවලට සාපේක්ෂව රාජ්‍ය විශ්ව විද්‍යාලවල කාර්ය මණ්ඩල සංයුතිය අසාමාන්‍ය බවක් දිස්වේ.

(iv) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාලවලින් මූල්‍යාධාර ලබාගෙන ඇති සහ එලෙස ඇතුළත් වූ එකඟතාවන් අනුව ඔවුන්ගේ අධ්‍යයන වගකීම් සම්පූර්ණ නොකළ ආචාර්යවරුන් හට සිදුකර ඇති ප්‍රතිපාදන වෙන් කිරීම් ප්‍රමාණය රුපියල් මිලියන 1,300 කට වැඩිය. ඔවුන් සියලු දෙනාම දුප්පත් ශ්‍රී ලාංකිකයන්ගේ ලේ සහ දහඩිය මතින් විදේශයන්හි ලාභදායී රැකියා අවස්ථා භුක්ති විඳිති. උපකුලපතිවරුන් සියලු දෙනාම පාහේ මීට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වී අයවිය යුතු මුදල් අයකර ගැනීමට දක්වා ඇත්තේ ඇල්මැරුණු උනන්දුවකි.

(v) රාජ්‍ය විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු මසකට පැය 20ක් පමණක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වන බව අනාවරණය වී ඇති අතර, වෙබ් අඩවිවල තිබෙන තොරතුරුවලට අනුව එක්සත් රාජධානියේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු මසකට පැය 140ක් පමණ සේවය කරන බව අනාවරණය වී ඇත.

(vi) උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමේදී සහ අදාළ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේදී නිරන්තර සහ අධික ප්‍රමාදයන් සිදුවේ.

(vii) අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයට අනුව විශ්වවිද්‍යාල සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවේ. අධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය, විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති කාර්ය මණ්ඩල හිඟයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ අඩු බඳවා ගැනීමේ මට්ටම් සහ ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන බුද්ධි ගලනයයි.

(viii) විශ්වවිද්‍යාල පරිපාලනය තම විශ්වවිද්‍යාලවල විනය පවත්වා ගැනීමට නිරන්තරයෙන් අසමත් වීම. බොහෝ ධනවත් දෙමාපියන් තම දරුවන් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීමට මැලිකමක් දක්වන්නේ නවක වදය නිසා ඔවුන්ට මුහුණ දීමට සිදුවන අමානුෂික සහ බිහිසුණු වද හිංසා හේතුවෙනි.

(ix) සමහර විශ්වවිද්‍යාලවල නවකයින්ට පළමු වසර තුළ පුස්තකාලවලට ඇතුළු වීම හෝ ඉංග්‍රීසි භාෂාවෙන් කතා කිරීම තහනම් කර ඇති අතර සමහර විට ඊළඟ වසර දක්වාද එය දීර්ඝව සිදු කිරීමට වේ. මෙවැනි ජ්‍යෙෂ්ඨයන්ගේ වගකීම් විරහිත හැසිරීම් නිසා බොහෝ සිසුන්ගේ ජීවිත අහිමි වී ඇත.

(x) උපකුලපතිවරුන් තේරීමේ ඡන්දවලින් ආයතන ක්‍රියාවලියට බොහෝ බාධා එල්ල වී ඇත. ඊට හේතුවන්නේ ඡන්දයෙන් පරාජය වන සමහර පරාජිතයින් ඔවුන්ගේ එදිරිවාදී ආකල්ප හේතුවෙන් විශ්ව විද්‍යාලවල සුමට ක්‍රියාකාරිත්වයට බාධා කිරීමට පෙළඹීමයි.

සමහර අවස්ථාවලදී ඔවුන් එවැනි ආයතවල කටයුතු කඩාකප්පල් කිරීමට ශිෂ්‍යයින්/ශිෂ්‍ය සංගම් පොළඹවන අවස්ථා ද ඇත.

(xi) පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා පළපුරුද්ද නොමැතිකම හේතුවෙන් ඇතැම් උපකුලපතිවරුන් විශ්වවිද්‍යාල පරිපාලනය කිරීමට ප්‍රමාණවත් හැකියාවක් නොදක්වන බව ද අවධාරණය කෙරේ.

(xii) සියලුම විශ්වවිද්‍යාලවලට ප්‍රධාන අංශ තුනක් ඇත, ඒවා නම්; අධ්‍යයන කටයුතු, ශිෂ්‍ය කටයුතු සහ පරිපාලනය. එක් පරිපාලකයෙක්, එනම් උපකුලපතිවරයෙකු, එවැනි සියලු වගකීම්වලින් යට වී සිටින අතර, ක්ෂේත්‍ර තුන පිළිබඳවම සුදුසුකම් නොමැති වීම සහ පළපුරුද්ද නොමැතිකම හේතුවෙන් එම පරිපාලනය අසාර්ථක වූ බව යම් අවස්ථාවලදී ඔප්පු වී ඇත.

(xiii) විශ්වවිද්‍යාලවලට පූර්ණ සුදුසුකම් නොමැතිව කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට පෙළඹී ඇති බැවින් ඔවුන් මහජන මුදලින් පශ්චාත් උපාධි සඳහා විදේශගත වෙති. එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු කාලයක් ඔවුන්ගේ සේවය නොලැබෙන අතර ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වැය කරන ලද මහජන මුදල් ආපසු ගෙවීම ද පැහැර හැර තිබේ. සුදුසුකම් ලත් විද්වතුන් බඳවා ගන්නේ නම්, ඉන් රජයට බරක් පැටවෙන්නේ නැත.


**3.26** දශක කීපයකට පෙර අපේ විශ්වවිද්‍යාල කැපී පෙනෙන මට්ටමකින් ශ්‍රේණිගත වී තිබූ අතර ඒවා කලාපයේ අනෙකුත් විශ්වවිද්‍යාලවලට වඩා බොහෝ ඉහළින් තිබූ බව නිරීක්ෂණය විය. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, පරිගණනය සහ අනෙකුත් තාක්ෂණික විෂයයන් සඳහා උපාධි අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය තරම් පහසුකම් ඇත. උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය (දැනට එය රාගම වෛද්‍ය පීඨය ලෙස භාවිත කෙරේ) සහ දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය ආයතනය (SAITM) අන්තවාදී කොටස්වල බලපෑම හේතුවෙන් වසා දැමීම තුළින් අපගේ සිසුන්ට මෙන්ම විදේශයන්හි සිටින සිසුන්ට අපගේ පද්ධතියට ඇතුළත් වීමේ ඉඩකඩ ඇහිරීමෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බරපතල පසුබෑමක් ඇති කර තිබේ. මේ නිසා මෙරට සිසුන් උසස් අධ්‍යාපනය හැදෑරීමට විදේශගත වීමෙන් අපේ ආර්ථිකය අර්බුදකාරී තත්ත්වයකට තල්ලු කරමින්, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපතේ යාම සිදුවේ.

**3.27** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයන ලද සංඛ්‍යාලේඛනවලට අනුව, අධ්‍යයන ස්ථිර සේවක පුරප්පාඩු ඕනෑ තරම් ඇති අතර එම තොරතුරු පහත දක්වා ඇත.

වගු අංක 8: අධ්‍යයන පුරප්පාඩු සංඛ්‍යාව (ස්ථිර සේවක)

| | **විශ්ව විද්‍යාලය** | **2023.01.01 දිනට අධ්‍යයන පුරප්පාඩු (අනුමත ස්ථිර සේවක මණ්ඩලය )** |
|---|---|---|
| 1 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 247 |
| 2 | කොළඹ විශ්ව විද්‍යාලය | 162 |
| 3 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 209 |
| 4 | කැලණිය විශ්ව විද්‍යාලය | 129 |
| 5 | මොරටුව විශ්ව විද්‍යාලය | 227 |
| 6 | යාපනය විශ්ව විද්‍යාලය | 157 |
| 7 | රුහුණු විශ්ව විද්‍යාලය | 148 |
| 8 | නැගෙනහිර විශ්ව විද්‍යාලය | 91 |
| 9 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය | 53 |
| 10 | රජරට විශ්ව විද්‍යාලය | 100 |
| 11 | සබරගමුව විශ්ව විද්‍යාලය | 103 |
| 12 | වයඹ විශ්ව විද්‍යාලය | 58 |
| 13 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | 54 |
| 14 | සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය | 19 |
| 15 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | 49 |
| 16 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්ව විද්‍යාලය | 4 |
| 17 | වව්නියා විශ්ව විද්‍යාලය | 22 |

*ප්‍රස්තාරය 3: අධ්‍යයන පුරප්පාඩු වල ප්‍රවණතා (ස්ථිර සේවක)*




කෙසේ වෙතත් එක් එක් විශ්වවිද්‍යාලය විසින් කමිටුව වෙත ලබා දී ඇති සංඛ්‍යාලේඛන අනුව වසර මැද වන විට බොහෝ විද්වතුන් සහ වෘත්තිකයන් සංක්‍රමණය වීම හේතුවෙන් පුරප්පාඩු සංඛ්‍යාව වැඩි වී ඇත.

**3.28** ශිෂ්‍ය සංගම් නියෝජිතයන්ට අනුව, ඔවුන් පහත ගැටලුවලට මුහුණ දී සිටිති;

(i) මාර්ගගත අධ්‍යාපනය සඳහා උපාංග සහ අන්තර්ජාල පහසුකම් නොමැතිකම, සායනික භාවිතයන්, රසායනාගාර, පුස්තකාල, ආපනශාලා, නේවාසිකාගාර, ශ්‍රවණාගාර, පොදු කාමර, ක්‍රීඩා පහසුකම්, සනීපාරක්ෂක, දේශන ශාලා සහ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ වෛද්‍ය පහසුකම් ඇතුළු පහසුකම් සම්බන්ධ ගැටලු.

(ii) "මහපොළ" ශිෂ්‍යත්වය වැනි මූල්‍ය ශිෂ්‍යත්ව ලබාදීමේ ප්‍රමාදයන් ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර එම ප්‍රමාදයන් අවම කර නොමැති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සුදුසුකම් ලත් සිසුන් සඳහා කාලීන මූල්‍ය ආධාරයක් නොලැබේ.

(iii) අධ්‍යයන වාර විභාග පැවැත්වීම, ප්‍රායෝගික විභාග පැවැත්වීම, විභාග හා අධ්‍යයන දින දර්ශන නිකුත් කිරීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාදයන් නිරීක්ෂණය වී ඇත.

(iv) දේශන සහ විභාග අවලංගු කිරීම සහ කල් දැමීම හේතුවෙන් විශේෂයෙන් රේඩියෝග්‍රැෆි/රේඩියෝ චිකිත්සාව වැනි ක්ෂේත්‍රවල පාඨමාලා නවතා දැමීම නිරීක්ෂණය කරන ලදී.

**3.29** උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ද කමිටුව විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඒවා පහතින් සඳහන් කර ඇත.

(i) තවත් මාර්ගගත උපාධි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

(ii) උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමේ අවම සුදුසුකම් නිර්ණායක නියාමනය කිරීම සහ යෝග්‍යතා පරීක්ෂණ හඳුන්වා දීම.

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අධීක්ෂණය යටතේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වර්ග දෙකෙහිම තත්ත්ව සහතිකය සහ ප්‍රතීතනය අධීක්ෂණය කිරීම.

(iv) සිසුන් 70,000කට පමණ අවම පාඨමාලා ගාස්තුවකට අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා 'ශ්‍රී ලංකා පරිගණක විද්‍යා විශ්වවිද්‍යාලය' සහ 'ශ්‍රී ලංකා අතථ්‍ය (virtual) විශ්වවිද්‍යාලය' පිහිටුවීම.

(v) වෛද්‍ය අධ්‍යාපනය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියාමන රාමුව තුළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිහිටුවීමට යෝජනා කිරීම.

(vi) පෞද්ගලික සහ රාජ්‍ය පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් විශ්වවිද්‍යාල පිහිටුවීම, නව්‍ය සහ අන්තර්ග්‍රාහී අධ්‍යාපන ආයතන නිර්මාණය කිරීම සඳහා ඔවුන්ගේ සාමූහික ප්‍රයත්නයන් උපයෝගී කර ගැනීම.

**3.30** උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ද කමිටුව විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඒවා පහතින් සඳහන් කර ඇත.

(i) විදේශයන්හි මණ්ඩප පිහිටුවීම.

(ii) පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලවල ශාඛා මණ්ඩප පිහිටුවීම.

(iii) වත්මන් ණය යෝජනා ක්‍රමය පුළුල් කිරීම

(iv) උසස් අධ්‍යාපනික උන්නතිය සඳහා රාජ්‍ය-පෞද්ගලික-හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

(iv) ප්‍රසාද ලකුණු සිතියම්ගත කිරීම හරහා පාර්ශ්වීය ප්‍රවේශ /සහ අමතර ලකුණු දීමේ සංකල්පය ප්‍රවර්ධනය කිරීම.

(v) අ.පො.ස (උ.පෙළ) භෞතික විද්‍යාව හැර වෙනත් ඕනෑම විෂය ධාරාවක් හැදෑරූ සිසුන්ට පරිගණන උපාධි සඳහා ඇතුළත් වීමට ඉඩ සලසන සම්බන්ධිත පාඨමාලා සංකල්පය ප්‍රවර්ධනය කිරීම.

(vii) සහයෝගීතා මාර්ගගත ඉගෙනුම් ක්‍රමයේදී මිශ්‍ර ඉගෙනුම් ක්‍රම ජනප්‍රිය කිරීම.

(viii) සියලුම උසස් අධ්‍යාපන සපයන්නන්ගේ තත්ත්ව සහතික කිරීම සහ ප්‍රතීතනය සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම.

**3.31** උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ද කමිටුව විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඒවා පහතින් සඳහන් කර ඇත.

(i) රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දෙකම නියාමනය කිරීමට සහ අංශ දෙකටම තත්ත්ව සහතික සේවා සැපයීම සඳහා උසස් අධ්‍යාපන නියාමන ආයතනය වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පුළුල් කිරීම.

(ii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය කිරීම සඳහා ස්වාධීන ප්‍රතීතන නියෝජිතායතනයක් පිහිටුවීම.

(iii) උපාධි අපේක්ෂක අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා හොඳින් ස්ථාපිත විශ්වවිද්‍යාලවල ශාඛා මණ්ඩප සඳහා පහසුකම් සැලසීම.

(iv) ප්‍රාදේශීය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන විවෘත කිරීම සහ පුළුල් කිරීම සහ නවීන ඉගැන්වීම්-ඉගෙනුම් පහසුකම් ලබා ගැනීම.

(v) ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැඩිවන ඉල්ලුමක් ඇති වැදගත් විෂය ක්ෂේත්‍ර සඳහා විශේෂ අරමුණු සහිත විශ්වවිද්‍යාල පිහිටුවීම.

(vi) සමාජීය වශයෙන් පිළිගත්, ආකර්ශනීය , විකල්ප තෘතීයික අධ්‍යාපන මාර්ගයක් ලෙස වෘත්තීය සහ පුහුණු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

(vii) බාහිර උපාධි පාඨමාලා විධිමත් කිරීම ඉලක්ක කර ගනිමින් සිදු කෙරෙන ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීමට පියවර ගැනීම.

(viii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE)/ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (ATI) සඳහා උපාධි ප්‍රදානය කිරීමට හැකියාව ලබාදීම සහ ඔවුන්ගේ පාඨමාලා ගුණාත්මක බවින් ඉහළ නැංවීම.

(ix) උසස් අධ්‍යාපනය සඳහා පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

(x) විදේශීය සිසුන්ට පහසුකම් සැලසීම සඳහා ස්ථාපිත විශ්වවිද්‍යාලවල ධාරිතාව ශක්තිමත් කිරීම.

(xi) රාජ්‍ය විශ්වවිද්‍යාලවල සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීමට පියවර ගැනීම.

# 04 වැනි පරිච්ඡේදය

## කාරක සභාවේ නිර්දේශ

ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ ලබා දීමට කාරක සභාව තීරණය කළේය. අධ්‍යාපනයේ ගුණාත්මකබව, කාර්යක්ෂම බව සහ ඵලදායීතාව සහතික කරන අතර උසස් අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම සහ පුළුල් කිරීම වෙනුවෙන් මෙම ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. ව්‍යවස්ථාදායකය, ආණ්ඩුව සහ අධ්‍යාපනය භාරව සිටින බලධාරීන් මෙම නිර්දේශ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය මත පදනම්ව අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්මත කරගත යුතු බව ද කාරක සභාව නිර්දේශ කරයි.

කාරක සභාව ඉහත ප්‍රකාශිත ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සම්බන්ධයෙන් වන නිර්දේශ පහසුව පිණිස නැවත දක්වයි.

**4.1** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (2) (ඌ) ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති ලෙස,

> *"නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවක දී ම සර්ව සාධාරණ සහ සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම"*

රාජ්‍ය ප්‍රතිපත්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (2) (ඌ) ව්‍යවස්ථාවට අනුකූල විය යුතු ය.

## 4.2 මුල් ළමාවිය/ළදරු පාසල් අධ්‍යාපනය

**4.2.1** රටේ සියලුම ළමුන්ට මුල් ළමාවිය සහ ළදරු පාසල් අධ්‍යාපනය හඳුන්වාදීම සඳහා රජය විසින් සුදුසු ප්‍රතිපත්තියක් සම්මත කරගත යුතු ය. නීති හෝ රෙගුලාසි හරහා එබඳු ප්‍රතිපත්තියක් රාජ්‍යය ප්‍රතිපත්තියට ඒකාබද්ධ කිරීම ඥානාන්විත වේ.

**4.2.2** ඉහත සඳහන් කාර්යය වෙනුවෙන් ආයතන පිහිටුවීමට සහ පුළුල් කිරීමට රජය විසින් පෞද්ගලික අංශය දිරි ගැන්විය යුතු අතර සියලු ළමුන්ට එබඳු අධ්‍යාපනය කරා සමාන ප්‍රවේශය තිබෙන බව සහතික කිරීම පිණිස මූල්‍ය සහාය ලබා දිය යුතු ය.

**4.2.3** රජය විසින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සිටින ළමුන් ට වෙනස් කොට නොසලකන ආකාරයෙන් සමාන අධ්‍යාපන ලැබෙන බව සහතික කරමින්, ළමුන්ගේ වයස මත පදනම් වූ යෝග්‍ය විෂයමාලාවක් සම්මත කර ගත යුතුය.

**4.2.4** මුල් ළමාවිය අධ්‍යාපනය වෙනුවෙන් විශේෂිත වූ ගුරු අධ්‍යාපනය සහ පුහුණුව වෙනුවෙන් ආයතනයක් (මධ්‍යස්ථාන හා සමඟම) රජය විසින් ස්ථාපනය කළ යුතු ය.

**4.2.5** නිසි කළමනාකරණය, අවශ්‍ය යටිතල පහසුකම්, ගුරු සුදුසුකම් සහ මධ්‍යගත දත්ත සමුදායක් සහතික කිරීම සඳහා නියාමන රාමුවක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

## 4.3 ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය

**4.3.1** පාසල් ජාතික පාසල් සහ පළාත් පාසල් ලෙස වර්ගීකරණය කිරීම නිසා විවිධ පැතිවලින් පාසල් වර්ග දෙක අතර විශාල පරතරයක් නිර්මාණය වී ඇති අතර, එමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(h) මඟින් සහතික කර ඇති සමානාත්මතාවය උල්ලංඝනය වේ. අධ්‍යාපනයේ සමානාත්මතාවය සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා රජය ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය.

**4.3.2** වාර්ගිකත්වය, භාෂා සහ ආගම් අනන්‍යතා අනුව පාසල් කාණ්ඩගත කිරීම ප්‍රජාවන් අතර දුරස්ථ බව නිර්මාණය කර සමාජය තුළ අසමඟියට සහ අවිශ්වාසයට මඟ පාදා තිබේ.යටත් විජිත පාලකයන්ගේ සමයේ සිට ඇරඹී සමාජයේ විවිධ කොටස් හුරු වූ ගැඹුරට මුල් බැසගත් සංස්කෘතියක් තිබී ඇති හෙයින්, එම පද්ධතිය තුළ විප්ලවීය ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී බොහෝ බාධක සහ ප්‍රතිරෝධතා ඇති විය හැකි නමුත් සමාන අවස්ථා සහිතව සියල්ලන්ට අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම සහ අවශ්‍යතාව පිළිබඳව සෑම මට්ටමකම ජනතාව දැනුවත් කිරීම මඟින් මෙම ගැටළුව ක්‍රමිකව විසඳීමට අපි නිර්දේශ කරන්නෙමු.

**4.3.3** අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ පළාත් සභාවල වගකිව යුතු පාර්ශවකරුවන් සහිතව සෑම පළාතකම සෑම අධ්‍යාපන කලාපයකම ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීම සහ 1 වැනි ශ්‍රේණියේ සිට 7/8 වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා දීමේ වගකීම ප්‍රාථමික පාසල්වලට (පෝෂක පාසල්) භාර වන සහ 7/8 වැනි ශ්‍රේණියේ සිට අ.පො.ස. උසස් පෙළ දක්වා අධ්‍යාපනය ද්විතීයික පාසල්වලට (මධ්‍ය විද්‍යාල) භාර වන පොකුරු පාසල් පද්ධතියක් පිහිටුවීම.

**4.3.4** රාජ්‍ය අංශයේ පාසල් තුළ මධ්‍යගත ගුරු සේවයක් පිහිටුවීම සහ ඔවුන්ව පුහුණු කිරීමේදී ඒකමතිකභාවයක් පවත්වා ගැනීම.

**4.3.5** කටපාඩමින් ඉගෙනීමේ අධ්‍යාපන ක්‍රමය වෙනුවට සිසුන්ගේ බුද්ධිය සහ ඥානය වර්ධනය කරන අතර ප්‍රජාතන්ත්‍රවාදී සහ සංස්කෘතික සම්මතයන් සහ සාරධර්ම අන්තර්ගත කිරීම සහිතව නවීන අධ්‍යාපන ක්‍රමවේද සහ විෂයමාලා හඳුන්වාදීම.

**4.3.6** තාක්ෂණය සහ විද්‍යාව යන ක්ෂේත්‍ර තුළ නවීන නැඹුරුතා වලට නිසි පිළිගැනීම ලබා දිය යුතු අතර රැකියා අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ අරමුණ ඇතිව ඒවාට ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

**4.3.7** දැරිය නොහැකි තරමේ ඉගෙනුම් කරුණු වල බර ළමුන් මත පටවනු නොලබන බවට වගබලා ගැනීම පිණිස, ඉගැන්වීම සිසුන්ගේ වයස මත පදනම්ව මෘදු කුසලතා කෙරෙහි කේන්ද්‍රගත විය යුතු ය.

**4.3.8** පාසල් පාදක ඇගයීම මත 50% ක් සහ විභාග පාදක සමත්වීම මත 50% යන මිශ්‍ර ලකුණු ක්‍රමයක් සම්මත කර ගැනීම මගින් විෂයමාලා සරල කිරීම. ( එක්සත් රාජධානියේ ක්‍රමය

විභාග පාදක කරගන්නා අතර ඇ.එ.ජ. ක්‍රමය පාසල් ඇගයීම පාදක කර ගනී. අපි මිශ්‍ර ක්‍රමයක් නිර්දේශ කරන්නෙමු.)

**4.3.9** එක් වසරක කාලපරිච්ඡේදයක් යොවුන් ජීවිත වලට ඉතා තීරණාත්මක වන බැවින් හා සිසුන් එබඳු විභාග වලට මුහුණ දීමට ප්‍රමාණවත් ලෙස පරිණතව සිටින බැවින්, 10 වැනි ශ්‍රේණියේ දී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමටත් 12 වැනි ශ්‍රේණියේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටීමටත්, පුනරීක්ෂණය කරන ලද හා යළි සකස් කරන ලද විෂයමාලා සමඟ උසස් අධ්‍යාපනයට ඇතුළත් වීමට සිසුන් සූදානම් කිරීම.

**4.3.10** සියලු පුද්ගලික පාසල් අධීක්ෂණය සඳහා රජය විසින් නීති පැනවිය යුතු අතර ලියාපදිංචිය, සම්පත්, යටිතල පහසුකම්, ධාරිතා, ගුණාත්මකබව සහ ප්‍රමිති, සමාජ වගකීම් යනාදිය වැනි අංශ සහතික කිරීම එයට ඇතුළත් විය යුතු ය.

**4.3.11** තාක්ෂණය සහ විද්‍යාව යන ක්ෂේත්‍ර තුළ නවීන නැඹුරුතා සැලකිල්ලට ගනිමින් දැනට පවතින ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන ක්‍රමවේද සහ විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය කිරීම.

**4.3.12** රජයේ සහ පුද්ගලික යන දෙවර්ගයේම පාසල්වල අනිවාර්ය විෂයයන් වෙනුවෙන් කිසිදු විශේෂයකින් හෝ වෙනස්කමකින් තොරව, සම්මත විෂයමාලාවක් තිබිය යුතු ය.

**4.3.13** විෂයමාලා සහ විෂයමාලාවලින් ආවරණය නොවූ ප්‍රශ්න මඟහරවා ගැනීම සඳහා විෂයමාලා සකසන්නන් සහ විභාග ප්‍රශ්න පත්‍ර සකසන්නන් අතර සම්බන්ධීකරණ පද්ධතියක් සැකසීම.

**4.3.14** භාෂා විෂයයන් එම භාෂාවේ සාහිත්‍යය විෂයය සමඟ එකිනෙක බැඳී තිබිය යුතු ය.

**4.3.15** ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම අවධාරණය කරන අතර ම, සියලු සිසුන්ට ජාතික භාෂා දෙකම ඉගෙනුමට සමාන අවස්ථා ලබා දීමේ ප්‍රතිපත්තියක් සම්මත කිරීම.

**4.3.16** ද්විතීයික අධ්‍යාපනය වෙනුවෙන් රජයේ මෙන්ම පුද්ගලික පාසල්වල වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ දිරි ගැන්වීම අරමුණු කරගත් විෂයමාලා රාජ්‍ය ප්‍රතිපත්තියට ඇතුළත් විය යුතු ය.

**4.3.17** නීරෝගී ජාතියක් ගොඩ නැගීමේ අරමුණින් ශාරීරික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් වල නිරත වීමට සිසුන්ව දිරි ගන්වනු ලබන බවට වගබලා ගැනීම.

**4.3.18** නිදහස් හා සාමකාමී මනසකින් තම අධ්‍යාපන කටයුතු වල යෙදීමට ළමුන්ට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන බැවින් සහ පවත්නා තරඟය, දීර්ඝ කාලීනව සිසුන් තුළ විෂාදය ඇතුළුව බොහෝ සමාජ ගම්‍යයන්ට මඟ පාදන බැවින්, සිසුන් අතර දැනට පවතින අසාධාරණ තරඟය තුරන් කිරීම සහ පෞද්ගලික උපකාරක පන්ති මත යැපීමෙන් සිසුන්ව ක්‍රමිකව මුදවා ගැනීම. තෘතීය අධ්‍යාපනය වෙනුවෙන් දැනට පවතින සීමිත අවස්ථා මෙබඳු තරකාරිත්වයට සිසුන්ව පොළඹවා තිබෙන හෙයින් මෙම අවස්ථා පුළුල් වීමත් සමඟ එබඳු තරඟකාරිත්වයක් තවදුරටත් නොපවතිනු ඇත.

**4.3.19** සිසුන්ට ඔවුන්ගේ වටිනා කාලය අපතේ නොයවා උසස් අධ්‍යාපනයේ නිරත වීමට හැකි වන පරිදි අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල සාධාරණ කාලයක් තුළ නිකුත් කරනු ලබන බවට රාජ්‍ය බලධාරීන් වග බලා ගත යුතු ය.

**4.3.20** ජාත්‍යන්තර පාසල් යනුවෙන් හැඳින්වෙන සියළු පුද්ගලික පාසල්, ඒවායේ ධාරිතාව, අධ්‍යාපනයේ ගුණාත්මකබව, ප්‍රමිතිය, විෂයමාලා සහ ක්‍රමවේද ඇතුළත්ව ලියාපදිංචිය සහ නියාමනය වෙනුවෙන් රජය නීති පැනවිය යුතු ය.

## 4.4 උසස් අධ්‍යාපනය

ඉහත දක්වා ඇති සියලුම කරුණු සහ හේතූන් සැලකිල්ලට ගනිමින් අපගේ කමිටුව සතුව පවතින බලතල අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

**4.4.1** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ 1995 අංක 12 දරණ පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ප්‍රතිස්ථාපනය කරමින් නව පනතක් මගින් ස්වාධීන "ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාවක්" පිහිටුවීම.


**4.4.2** කොමිෂන් සභාව සාමාජිකයින් 11 දෙනෙකුගෙන් (හෝ සුදුසු සංඛ්‍යාවකින්) සමන්විත විය යුතු අතර ඔවුන් ශාස්ත්‍රීය, වෘත්තිය සහ කළමනාකරණය වැනි අදාළ ක්ෂේත්‍රවල සැලකිය යුතු විශිෂ්ටත්වයක් අත්කරගත් පුද්ගලයන් විය යුතුය.

**4.4.3** කොමිෂන් සභාවට එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ස්වාධීනව ක්‍රියාත්මක කිරීමට බලය තිබිය යුතුය.

**4.4.4** කොමිෂන් සභාවේ සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර ඔවුන් වසර තුනක කාලයක් එම ධූරවල අඛණ්ඩව රැඳී සිටිය යුතුය. ජනාධිපතිවරයා විසින් එසේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා පත් කළ යුතුය.

**4.4.5** කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සහ එහි රීති තුළ දක්වා ඇති නිර්ණායක අනුව නිශ්චිත සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත අනුකමිටු පිහිටුවීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතුය. පහත සඳහන් කාණ්ඩ සඳහා මෙම අනු කමිටු පිහිටුවනු ලැබිය යුතුය.

(i) රාජ්‍ය විශ්වවිද්‍යාල
(ii) රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල/ආයතන
(iii) වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාල/ආයතන
(iv) තත්ත්ව සහතිකය




**4.4.6** එවැනි සෑම කමිටුවක්ම එහි විෂය පථය තුළ ආයතන නියාමනය කිරීමේදී එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ස්වාධීනව ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති සහ මූලධර්ම පිළිබඳ සියලු තීරණ එහි රීති මගින් සම්මත කර ඇති පරිදි සම්පූර්ණ කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතුය.

**4.4.7** එම නව පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ක්‍රියාත්මක වූ රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල/ආයතන යන සියලුම දැනට පවතින උසස් අධ්‍යාපන ආයතන, එම නව පනත යටතේ ලියාපදිංචි විශ්වවිද්‍යාල/ආයතන ලෙස සැලකිය යුතුය.

**4.4.8** නව නීති/පනත් යටතේ අවශ්‍ය රෙගුලාසි, රීති, අනු නීති, ආඥාපනත් පනවන තෙක් විශ්ව විද්‍යාල පනත සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත යටතේ වන සියලුම රෙගුලාසි, රීති, අනු නීති, ආඥාපනත්, අමාත්‍යවරයා සහ අනෙකුත් ආනුෂංගික මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ක්‍රියාත්මක වේ.

**4.4.9** උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල/ආයතන පිහිටුවීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් රෙගුලාසි සම්පාදනය කළ යුතුය. ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම්, උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා පිළිගනු ලබන පාඨමාලා, එක් එක් පාඨමාලාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය අවම කාලය, අභ්‍යන්තර තත්ත්ව සහතිකය සඳහා වූ ක්‍රියා පටිපාටි සහ අනෙකුත් අවශ්‍ය ප්‍රමිතීන් එම රෙගුලාසි මඟින් සඳහන් කරනු ඇත.

**4.4.10** කොමිෂන් සභාව විසින් එහි කාර්යයන්, බලතල සහ රාජකාරි ක්‍රියාත්මක කිරීමට අදාළ නීති රීති මෙන්ම එහි කාර්යයන්ට ආනුෂංගික කරුණු සම්පාදනය කළ යුතුය.

**4.4.11** ආයතන කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය දිරිමත් කිරීම සහ සුදුසු ආපසු ගෙවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යටත්ව සිසුන්ට මූල්‍ය ආධාර සැපයීම.

**4.4.12** අමාත්‍යවරයා සහ කොමිෂන් සභාව විසින් සකස් කරන ලද රෙගුලාසි සහ රීති අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අනුමත නොවුනහොත් දැනටමත් සිදු කර ඇති කිසිදු ක්‍රියාවකට අගතියක් නොවන පරිදි ඒ සියල්ල අවලංගු කළ ලෙස සලකනු ලැබේ.

**4.4.13** අර්ධකාලීන අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සහ සායනික අධ්‍යයන සහ පුහුණුව වැනි පහසුකම් ඇතුළත් කර විදේශීය සිසුන් දිරිමත් කිරීමට සහ පහසුකම් සැලසීමට කොමිෂන් සභාව නව්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතුය.

**4.4.14** සිසුන්ට නාමික පාඨමාලා ගාස්තුවක් සමඟ අධ්‍යාපන අවස්ථා ලබා දීම සඳහා 'ශ්‍රී ලංකා පරිගණක විද්‍යා විශ්ව විද්‍යාලය' සහ 'ශ්‍රී ලංකා අතථ්‍ය (Virtual) විශ්ව විද්‍යාලය' පිහිටුවීම.

**4.4.15** නවීන ඉගැන්වීම් ඉගෙනුම් පහසුකම් ඇතුළත් කරමින් කලාපීය දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම හා පුළුල් කිරීම.

## I. රාජ්‍ය විශ්වවිද්‍යාල

**4.4.16** රාජ්‍ය විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වය ආරක්ෂා කරමින් මූල්‍ය, යහපාලනය, වගවීම සහ විනිවිදභාවය පිළිබඳ වගකීම පවරමින් රාජ්‍ය විශ්වවිද්‍යාලවල පරිපාලන පද්ධතිය ප්‍රතිසංස්කරණය කළ යුතුය.

**4.4.17** රාජ්‍ය විශ්වවිද්‍යාල/ආයතනවල බලධාරීහු සිය සියලු බලතල, කාර්යයන් සහ රාජකාරි නිසි අයුරින් ඉටු කළ යුතුය.

**4.4.18** ඔවුන් තම විශ්වවිද්‍යාලවලට/ආයතනවලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී, තාරුණ්‍යයේ කාලයෙහි වටිනාකම, විශේෂයෙන්ම ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා වැය කිරීමට සිදුවන සීමිත කාලසීමාව ඇතුළු නොයෙකුත් දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් එම දුෂ්කරතා වළක්වා ගැනීමට කිසිදු ප්‍රමාදයකින් තොරව එම කටයුතු කළ යුතුය.

**4.4.19** විවිධ පීඨ සහ දෙපාර්තමේන්තු සඳහා වෙන් කර ඇති ගොඩනැගිලි සහ පහසුකම් විශාල ප්‍රමාණයක්, පැය කිහිපයක් පමණක් භාවිත කර හෝ භාවිත නොකරමින් අපගේ විශ්ව විද්‍යාල අනුගමනය කරනු ලබන අවිචාරවත් පිළිවෙත අනුගමනය නොකර රාජ්‍ය විශ්වවිද්‍යාල/ආයතනවල බලධාරීන් විසින් තම ආයතනවල සම්පත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගන්නා බවට සහතික විය යුතුය.

**4.4.20** රාජ්‍ය විශ්වවිද්‍යාල/ආයතනවල බලධාරීන් විසින් නියමිත කාල සීමාව තුළ සිසුන් තම අධ්‍යාපන පාඨමාලා සම්පූර්ණ කරන බවට සහතික විය යුතු අතර වෛද්‍ය විශේෂඥයන් විසින් සහතික කරනු ලැබුවහොත් පමණක් සෞඛ්‍ය හේතූන් මත වසරක දීර්ඝ කිරීමක් පමණක් ලබා දිය හැකිය.

**4.4.21** රාජ්‍ය විශ්වවිද්‍යාලවල බලධාරීන් තම ආයතනවල විනය පවත්වා ගනිමින් අධ්‍යයන කටයුතු සඳහා සුමටව ක්‍රියාත්මක වීමට හිතකර සාමකාමී පරිසරයක් පවතින බවට සහතික විය යුතුය.

**4.4.22** නම්‍යශීලී නිර්ණායකයක් අනුගමනය කිරීමෙන් සිසුන්ට තමන් කැමති විෂය ධාරාවන් තෝරා ගැනීමට බලධාරීන් අවසර දිය යුතුය.

**4.4.23** සංවර්ධිත රටවල සිදු කරනු ලැබෙන පරිදි සිසුන්ට සමාන හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට හැකි වන පරිදි දැනට පවත්නා නවීකරණයන්ට අනුකූල වන පරිදි බලධාරීන් නව අධ්‍යාපන ක්‍රමවේද සහ විෂයමාලා අනුගමනය කළ යුතුය. එමෙන්ම සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා කුසලතාවය වැඩිදියුණු කළ යුතු අතරම සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වීමට සිසුන් දිරිමත් කළ යුතුය.

**4.4.24** ඉගැන්වීමේ කාර්යය සඳහා සාධාරණ කාල සීමාවක් කැප කෙරෙන පරිදි කථිකාචාර්යවරුන්ගේ වැඩ විධිවිධාන ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

**4.4.25** අන්තර්ජාතිකව පිළිගත් මනා පරිචයන් අනුව අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රතිපාදන පුළුල් කෙරෙන බවට බලධාරීන් වග ලබා ගත යුතුය.

## II. රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල/ආයතන

**4.4.26** ප්‍රමාණවත් දිරිගැන්වීම් සහ මාර්ගෝපදේශ සහිතව පෞද්ගලික අංශයේ පිළිගන්නා උසස් අධ්‍යාපන, විශ්වවිද්‍යාල සහ ආයතන සඳහා නීතිමය රාමුවක් රජය විසින් හඳුන්වා දිය යුතුය.

**4.4.27** කොමිෂන් සභාව විසින් පුද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කළ යුතු අතර, සමාජ-ආර්ථික වගකීම් ඉටු කිරීමේ කොන්දේසියට යටත්ව දිරිගැන්වීම් ලබා දිය යුතුය. මෙහි දී ජනගහනයේ දුප්පත්ම පුද්ගලයන්ට නොමිලේ අධ්‍යාපන අවස්ථා ලබා දීම සඳහා එවැනි ආයතන වලට ඇතුළත් කරගන්නා නිශ්චිත සිසුන් ප්‍රතිශතයක් වෙන් කිරීම වැනි කොන්දේසි ඇතුළත් කළ හැකිය.

**4.4.28** රාජ්‍ය-පෞද්ගලික-හවුල්කාරිත්ව විශ්වවිද්‍යාල/ආයතන දිරිමත් කළ යුතුය.

**4.4.29** ලාභ නොලබන සංවිධානවල ක්‍රමවේදය අනුගමනය කරමින් භාරවලට සමාන හෝ ඇපකර ආයතන වලට සමාන ආකාරයේ විශ්වවිද්‍යාල පිහිටුවීම දිරිමත් කළ යුතුය.

**4.4.30** අධ්‍යයන සහ වෘත්තීය අධ්‍යාපනය යන ද්විත්වයටම අවධානය යොමු කරමින්, වඩාත් සුදුසු රාජ්‍ය-පෞද්ගලික-හවුල්කාරිත්ව ආකෘති හරහා දිස්ත්‍රික්ක 25ක විශ්වවිද්‍යාල 25ක් පිහිටුවීමේ වැඩසටහනක් ආරම්භ කිරීම. ''නගර මණ්ඩප'' සංකල්පයට අනුගත වන සෑම ප්‍රදේශයකම පවතින සම්පත් සැලකිල්ලට ගනිමින් වෘත්තීය අධ්‍යයනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

**4.4.31** ඉඩම්, ප්‍රවාහනය, ජලය, විදුලිය සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් වැනි අවශ්‍ය යටිතල පහසුකම් සපයා උසස් අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශයේ ආයෝජකයින් දිරිමත් කළ යුතුය.

**4.4.32** විදේශීය ආයෝජකයින්ට සුදුසු දිරිගැන්වීම් සහ ප්‍රතිලාභ ලබා දීමෙන් ආයෝජනය කිරීමට උනන්දු කළ යුතුය.කමිටුවේ ඉල්ලීම පරිදි, ආයෝජන මණ්ඩලය (BOI) කාරක සභාව හමුවේ පෙනී සිටි අතර දේශීය හා විදේශීය උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සහිත ඉඩම් ලබාදීමට තමන්ට කැමැත්ත සහ හැකියාව ඇති බවට සහතික විය.

**4.4.33** පනත යටතේ සකස් කරනු ලබන රෙගුලාසිවල විස්තර කෙරෙන පරිදි අවශ්‍ය ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ කොන්දේසිය මත, පුද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතනවලට ''විශ්වවිද්‍යාල'' යන යෙදුම භාවිතා කිරීමට අවසර ලබා දිය යුතුය.

### III. වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාල/ආයතන

**4.4.34** තාක්ෂණික අධ්‍යාපන ආයතනවල පාඨමාලා උසස් කිරීම මඟින් උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වයට උත්ශ්‍රේණිගත කිරීම. ඊට අමතරව, වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂිත ප්‍රමිතීන් අනුව පවත්වාගෙන යන වෙනත් ආයතන ද උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස උසස් කළ හැකි බව බලධාරීන් විසින් හඳුනා ගත හැකිය.

**4.4.35** ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වැඩිවන ඉල්ලුමක් සහිත වැදගත්කමකින් යුත් නැඟී එන ක්ෂේත්‍ර සඳහා විශේෂ අරමුණු සහිත විශ්වවිද්‍යාල පිහිටුවීම.

**4.4.36** ආකර්ශනීය සහ සමාජීය වශයෙන් පිළිගත් විකල්ප තෘතීයික අධ්‍යාපන මාර්ගයක් ලෙස වෘත්තීය සහ පුහුණු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

**4.4.37** අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී නොසිටි හෝ සමත් නොවූ අයට උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමට පදනම් පාඨමාලා හඳුන්වා දීම.

**4.4.38** අ.පො.ස (උ.පෙළ) භෞතික විද්‍යාව හැර වෙනත් ඕනෑම විෂය ධාරාවක් හැදෑරූ සිසුන්ට පරිගණක උපාධි සඳහා ඇතුළත් වීමට ඉඩ සලසන සංයුක්ත පාඨමාලා සංකල්පය ප්‍රවර්ධනය කිරීම.

**4.4.39** කර්මාන්ත, කෘෂිකර්මාන්තය සහ ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් කාර්මික ආධුනික ආයතන හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම.

## IV. තත්ත්ව සහතිකය

**4.4.40** අමාත්‍යවරයා විසින් රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොවන අංශයේ සියලුම උසස් අධ්‍යාපන ආයතන තත්ත්ව සහතික අවශ්‍යතාවන්ට අනුකූලව පවත්වාගෙන යන බවට සහතික වීම සඳහා රෙගුලාසි සම්පාදනය කළ යුතුය.

**4.4.41** රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය නොවන අංශයේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රදානය කරනු ලබන උපාධි සහතික කිරීම සඳහා ප්‍රතීතන ක්‍රමයක් අනුගමනය කිරීමට වෙන්වූ ආයතනයක් තිබිය යුතුය.

**4.4.42** පිරිවෙන් අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ කිරීම පිළිබඳව වෙනම සාකච්ඡාවක් පැවැත්වීම යෝග්‍ය වේ.

2023 ජූලි 13 දක්වා පැවති සියලුම කාරක සභා රැස්වීම් වල කාර්යසටහන්, ගරු කාරක සභික මන්ත්‍රීවරුන් සහ විවිධ ආයතනයන්හි නිලධාරීන් විසින් කළ ඉදිරිපත් කිරීම් විශේෂ කාරක සභා වාර්තාවේ II වෙළුමට ඇතුළත් කර ඇත.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාමාජිකයන් වන අපි මෙම කාරක සභාවේ වාර්තාව අනුමත කරමු.

ගරු. ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා ..........................

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා ..........................

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය ..........................

ගරු අ. අරවින්ද් කුමාර් මහතා අනුමත කරන ලදී.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා අනුමත කරන ලදී.

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා ..........................

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා ..........................

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය අනුමත කරන ලදී. (විදේශගතව ඇත)

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා ..........................

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය ..........................

..........................
ඉන්දිරා දිසානායක
කාරක සභාවේ ලේකම්

Annexure $X_1$

**Officials Presented at Committee Meetings**
*(From 21st February 2023 to 13th July 2023)*

| Institution | Personals |
|---|---|
| **University Grants Commission** | (Sn. Prof.) Sampath Amaratunge<br>Chairman |
| | (Prof.) Chandana P Udawatte<br>Vice Chairman |
| | (Dr.) Priyantha Premakumara<br>Secretary |
| | (Prof.) Vasanthy Arasaratnam<br>Member |
| | (Prof.) Premakumara de Silva<br>Member |
| | (Prof.) A.K.W. Jayawardane<br>Member |
| | Mr.Palitha Kumarasinghe<br>Member |
| | (Prof.) Premakumara de Silva<br>Member |
| **Ministry of Education** | Mr. M. N. Ranasinghe<br>Secretary |
| | (Prof.) Gunapala Nanayakkara<br>Advisor to the Minister of Education |
| | Mr. H. J. M. C. A. Jayasundara<br>Commissioner-General of Examinations |
| | Mr. K. A. D. Punyadasa<br>Chief Commissioner (Teacher Education) |
| | Mrs. P. C. K. Pirisyala<br>Director of Education (Private Schools) |
| | (Dr.) K. P. Munagama<br>Director of Education (Technical Education) |
| | Mrs. K. A. J. Prishangika<br>Director of Education (Policy and Planning) |
| | (Dr.) I.M.K.B. Illangasinghe<br>Additional Secretary |
| | Mrs. H.D.C. Janaki<br>Director (Student Loan) |
| | Ms. T.K.W.T.P. Premarathna<br>Assistant Director (Student Loan) |

| Institution | Personals |
|---|---|
| | Mr. W.T.B. Sarath<br>Director (Science) |
| **Ministry of Education** | Mrs. D. N. P. Pullaperuma<br>Assistant Director of Education |
| | (Prof.) Gunapala Nanayakkara<br>Advisor to the Minister of Education |
| | Mr. H. J. M. C. A. Jayasundara<br>Commissioner-General of Examinations |
| | Ms. P.W. Amaradiwakara<br>Director (School Activities) |
| | Mr.K.R Uduwawala<br>Additional Secretary |
| *Non-State Higher Education* | Mrs. J.A.C.H.Jayasinghe<br>Director |
| | Mrs. W.H.M.M.C.K.Dayarathne<br>Additional Secretary |
| | Ms. K.T.Sajini Wejesiriwardena<br>Assistant Director |
| **National Education Commission** | (Prof.) Harischandra Abeygunawardena<br>Chairman |
| **World Bank (AHEAD Project)** | (Dr.) Kumudika Boyagoda |
| | |
| **State Universities** | |
| 1. *University of Colombo* | Prof. Chandrika Wijeyaratne<br>Former Vice Chancellor |
| 2. *University of Peradeniya* | Prof. M.D Lamawansa<br>Vice Chancellor |
| *The Open University of Sri Lanka* | Prof. P.M.C. Thilakerathna<br>Vice Chancellor |
| | Dr. H.G.P.A. Ratnaweera<br>Dean (Faculty of Engineering Technology) |
| **Universities registered under different statutes** | |
| 1. *Bhiksu University* | Senior Prof. Ven. Kanattegoda Saddharatana Anunayaka Thero<br>Vice Chancellor |
| | Ven. Galwewe Wimalakhanthi Thero<br>Dean |
| 2. *Buddhist & Pali University* | Prof. Ven. Moragollagama Uparathana Thero<br>Dean (Faculty of Graduate Studies) |
| | Ven. Illukwela Dhammarathana Thero |

| Institution | Personals |
|---|---|
| | Dean (Faculty of Buddhist Studies) |
| | Dr. K.G. Swarnananda Gamage<br>Dean (Faculty of Language Studies) |
| *Buddhist & Pali University* | Mr.E.A.Gunasena<br>Registrar (Acting) |
| *3. General Sir John Kotelawala Defence University (KDU)* | Major General MP Peiris<br>Vice Chancellor |
| | Mr. V.D. Kithsiri<br>Registrar |
| *4. Ocean University* | Prof. R.M.Wasantha Rathnayake<br>Vice Chancellor |
| *5. University of Vocational Technology* | Prof. Ranjith Premalal De Silva<br>Vice Chancellor |
| **Institutes registered under Ministry of Education** | |
| *1. SLTC Research University* | Mr. Ranjith G. Rubasinghe<br>Vice Chancellor/Founder |
| | Mr. Heminda Jayaweera<br>Director (Corporate Affairs and Engagement) |
| | Mr. Jagath Wijerathne<br>Director (Academic Affairs) |
| *2. CINEC Campus* | Admiral Thisara Samarasinghe<br>Senior Consultant |
| *3. NSBM Green University* | (Prof.) E.A.Weerasinghe<br>Vice Chancellor |
| *4. Sri Lanka Institute of Information Technology(SLIIT)* | Prof. Nimal Rajapakse<br>Senior Deputy Vice Chancellor |
| | Prof. Colin N. Peiris<br>Director (Academic Development & Quality Assurance) |
| *5. The KAATSU International for Undergraduate-studies (KIU)* | Ms. Nadeeka Ranadeva<br>Deputy Vice Chancellor |
| | Ms. Dilhara Rathnayake<br>Head of Marketing Division |
| *6. Institute of Surveying and Mapping* | Mr. U.K.S.P. Wijesinghe<br>Senior Deputy Survey General |
| | Mr. M.T.M. Rafeek<br>Senior Deputy of Surveys |
| *7. Legal Draftsman's Department* | Ms. V.S. Thushari |

| Institution | Personals |
|---|---|
| | Assistant Legal Draftsman |
| *8. SAB Campus of CA Sri Lanka* | Senior Prof. Ariyarathna Jayamaha<br>Director |
| *9. Aquinas College of Higher Studies* | Prof. C.A.N. Fernando<br>Rector |
| *Aquinas College of Higher Studies* | Mr. Lalindra De Silva Wijeyaratne<br>Registrar |
| *10. Horizon Campus* | Mr. Upul Daranagama<br>Chairman |
| *11. National Institute of Social Development (NISD)* | Ms. M.T.R.Shamini Attanayake<br>Director General |
| | Mrs. C.H.D. Hettiarachchi<br>Registrar |
| *12. Sri Lanka Institute of Development Administration (SLIDA)* | Mr. K.D.N. Ranjith Asoka<br>Director General (Acting) |
| *13. SIBA Campus* | Assistant Prof. Ms. Hasanthie Yapa Dahanayake |
| *14. Sri Lanka Institute of Nanotechnology (SLINTEC)* | Prof. Viranja Karunarathna<br>Vice Chancellor |
| *15. Saegis Campus* | Prof. Nalaka Jayakody<br>Vice Chancellor |
| *16. Institute of Chemistry Ceylon* | Prof. Namal Priyantha<br>Senior Lecturer |
| | Mr. Sanjaya Hettigedara<br>President |
| *17. ESOFT Metro Campus* | Dr. Dayan Rajapakse<br>Chairman |
| | Mr. Nishan Sembacuttyarachchi<br>Chief Executive Officer |
| *18. ICBT Campus* | Dr. Sampath Kannangara<br>Chief Executive Officer |
| | Mr. Anura Gamage<br>Director (Marketing) |
| | Mr. S. Chandramohan<br>Chief Academic Officer |
| | Mr. Sampath Perera<br>General Manager |
| *19. International Institute of Health Sciences (IIHS)* | Mr. H.P.A.L. Pinto<br>Registrar |

| Institution | Personals |
|---|---|
| *20. Royal Institute of Colombo* | Mr. Lasantha Amarakoon<br>Chief Operating |
| | Ms. Sudharma Chandrasiri<br>Lecturer and Academic Coordinator |
| *21. Nagananda International Institute of Buddhist Studies (NIIBS)* | Mr. W.D.S. Seneviratne<br>Head – Media Department |
| **Board of Investment** | Ms. Priyanka Samaraweera<br>Executive Director |
| | Mr. Prasanjith Wijayathilake<br>Executive Director |
| | Ms. Ganga Palaketiya<br>Senior Deputy Director |
| | Mr. G.R.C.Gamlath<br>Senior Deputy Director |
| | Ms. Thanuja Bandara<br>Deputy Director |
| | Ms. Priyanka Samaraweera<br>Executive Director |
| | Mr. Prasanjith Wijayathilake<br>Executive Director |
| **Federation of University Teachers' Association (FUTA)** | Prof. B.M.H.S.K. Banneheka |
| | Prof. Nirmal Devasiri |
| | Prof. Arjuna Parakrama |
| | Prof. Rohan Fernando |
| | Mr. Rohan Laksiri |
| | Dr. Pavithra Jayawardena |
| **LIRNEasia Research Institute** | Dr.Sujatha Gamage<br>Senior Fellow |
| **Wayamba Technical College** | Ms. R.A.A.R. Ranwella<br>Principal |
| | Mr. R.A.S.R.A. Ranwella<br>Deputy Principal |
| **Inter University Students Federation (IUSF)** | Mr. Wasantha Mudalige |
| | Rev. Galwewa Siridhamma |
| | Mr. A.M.Rifath |
| | Mr. A.H. Nawanjana Virashan |
| | Mr. H.M.N.L Hemantha |
| | Mr. S.T.M.Jayasinghe |
| | Mr. W K I I perera |

| Institution | Personals |
|---|---|
| | Mr. S B H N Bandara |
| | Mr. Gimhan Rupasinghe |
| **Attorney Generals' Department** | Mr. Sehan Soyza<br>State Councel |
| **Attorney Generals' Department** | Ms. Vishni Ganepola<br>State Counsel |
| **Legal Draftsmans' Department** | Ms. Thushari Vitharana<br>Assistant Legal Draftsman |
| **Legal Draftsmans' Department** | Ms. Shehara Weerakoon<br>Deputy Legal Draftsman |
| **Auditor Generals' Department** | Mrs. W.M.P.A. Fonseka<br>Deputy Auditor General |
| **Auditor Generals' Department** | Mrs. S.M.C. Indika<br>Superintendent of Audit |

Annexure $X_2$

## 24 Non-state Higher Education Institutions

| | |
|---|---|
| 1. | Institute of Surveying and Mapping |
| 2. | Sri Lanka Institute of Information Technology (Guarantee) Ltd (SLIIT) |
| 3. | Sri Lanka Institute of Development Administration |
| 4. | National Institute of Social Development |
| 5. | Aquinas College of Higher Studies |
| 6 | National School of Business Management Ltd (NSBM) |
| 7 | Colombo International Nautical and Engineering College (pvt) Ltd (CINEC) |
| 8 | Sri Lanka International Buddhist Academy |
| 9 | The Institute of Chartered Accountants of Sri Lanka |
| 10 | SANASA Campus Ltd |
| 11 | Horizon College of Businee & Technology (pvt) Ltd |
| 12 | KAATSU - Highly Advanced Medical Technology Training Centre (pvt) Ltd |
| 13 | Nagananda International Institute for Buddhist Studies |
| 14 | S L T Campus (pvt) Ltd |
| 15 | Sri Lanka Institute of Nanotechnology (pvt) Ltd |
| 16 | Saegis Campus (pvt) Ltd |
| 17 | Esoft Metro Campus (pvt) Ltd |
| 18 | Institute of Chemistry Ceylon |
| 19 | International College of Business Technology Ltd |
| 20 | Benedict XVI Catholic Institute of Higher Education (pvt) Ltd |
| 21 | Royal Institute Colombo (pvt) Ltd |
| 22 | Business Management School (pvt) Ltd |
| 23 | International Institute of Health Science (Pvt) |
| 24 | Lanka Nippon BizTech Institute (pvt) Ltd |